# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,085 - 2018 අගෝස්තු මස 24 වැනි සිකුරාදා - 2018.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

## තනතුරු ඇබෑර්තු

**විද්‍යා තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය**

### නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය

අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රධාන විධායක නිලධාරි) තනතුර

නවීන තාක්‍ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය (ACCIMT) විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන ව්‍යවස්ථාපිත ආයතනයකි. පර්යේෂණ හා සංවර්ධන, පුහුණු හා තාක්ෂණය හුවමාරු කිරීම මගින් ඉලෙක්ට්‍රොනික විද්‍යාව, සන්නිවේදනය, තොරතුරු තාක්ෂණය, රොබෝ විද්‍යාව සහ අභ්‍යාවකාශ තාක්ෂණය යන ක්ෂේත්‍රයන්හි, නවීන තාක්ෂණය හඳුන්වා දීම කඩිනම් කරවීමේ කාර්යය මෙම ආයතනය වෙත නියෝගාත්මකව පැවරී ඇත.

ඉහත තනතුර සඳහා, යෝග්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද සහිත විශිෂ්ඨ තත්වයේ සන්නිවේදන, නායකත්ව අන්තර් පුද්ගල සම්බන්ධතා සහ සංවිධාන කුසලතා ඇති නිපුන වෘත්තිකයන් වන ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

සේවක කාණ්ඩය : ජ්‍යෙෂ්ඨ කළමණාකරු

තනතුර සඳහා පැවරී ඇති රාජකාරීවල ස්වභාවය

අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රධාන විධායක නිලධාරි) යනු, ආයතනයෙහි ඉහළම මට්ටමේ විධායක නිලධාරි තනතුර වේ. ආයතනයේ සියලු ක්‍රියාකාරකම් සහ පරිපාලන සහ මූල්‍ය කටයුතු පිළිබඳ වගකීම මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙහෙයවීම සහ පාලනය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දී ඇති බලතල, කාර්යයන් සහ රාජකාරි ක්‍රියාත්මක කිරීමේ වගකීම ද මෙම තනතුර වෙත පැවරේ. එමෙන්ම ආයතනයේ කාර්ය මණ්ඩලය වෘත්තිය ජයග්‍රහණ කරා මෙහෙයවීම, තාක්ෂණ උත්පාදනය හා පවරා දීම සඳහා නායකත්වය ලබාදීම හා දිරිගැන්වීම ද මෙම තනතුරෙහි වගකීම් වේ.

තනතුරේ ප්‍රධාන රාජකාරි :

- ආයතනයේ සමස්ත පරිපාලනය සහ මූල්‍යමය පාලනය.
- ආදායම ඉහළ නැංවීම අරමුණ කර ගනිමින් ප්‍රගතිය ඉහළ නැංවීම පිණිස සැලසුම් සම්පාදනය හා කාර්යයන් මෙහෙයවීම
- ප්‍රතිපත්තිමය කාර්යයන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත උපදෙස් දීම
- අදළ නියෝජිත ආයතන අතර සම්බන්ධීකරණ කාර්යයන් සිදු කිරීම
- වෙනත් අදළ අයතනවල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා සහභාගී වීම
- ජාත්‍යන්තර නියෝජිත ආයතන සමග සම්බන්ධීකරණ කාර්යයන්හි නිරත වීම
- මෙරට දී සහ විදේශයන්හි දී පැවැත්වෙන සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය සඳහා සහභාගිත්වය
- ආයතනය සම්බන්ධ වාර්තා හා ප්‍රකාශන ඉදිරිපත් කිරීම
- පාලක මණ්ඩලය විසින් පවරනු ලැබූ වෙනත් රාජකාරි.

පත්වීමේ ස්වභාවය :

සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිත ස්ථිර පත්වීමකි (1994 අංක 11 දරන විද්‍යාව හා තාක්‍ෂණය වැඩිදියුණු කිරීමේ පනතෙහි 27(2) සහ 27(4) වගන්ති අනුව පස් අවුරුදු කාල සීමාවන් සඳහා වලංගුය)

සේවක කාණ්ඩයේ වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය (2020/01/01 දින සිට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2016 පූර්ණ ලෙස වලංගු වනු ඇත.)

HM 2-3-2016 (රු. 98,215-12x2,700-රු.130,615)

*මූලික වැටුප.* - රු. 77,827 + ජීවන වියදම් දීමනාව රු. 7,800 සහ රජය විසින් අනුමත කරනු ලැබූ වෙනත් දීමනා

සුදුසුකම් :

බාහිර (පහත 1 හෝ 2)

1. (අ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) ප්‍රදනය කිරීම සඳහා පිළිගැනෙන, ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාලයන් විසින් පිරිනමනු ලැබූ, අදළ ඉංජිනේරු විෂයයක් (ඉලෙක්ට්‍රොනික විද්‍යාව/විදුලි සංදේශ හෝ අදළ ක්ෂේත්‍රයක) පිළිබඳ සිව් වසරක, පූර්ණ කාලීන ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් සතු වී තිබීම;

හෝ

(ආ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගනු පිණිස සුදුසුකම් ලැබීමේ දී ඒ සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් ඉහත කී ඉංජිනේරු විෂය ක්ෂේත්‍රය හා අදළව පවත්වනු ලැබූ විභාගයේ සියලු කොටස් සම්පූර්ණ කොට සමත්ව තිබීම;

හෝ

(ඇ) වරලත් ඉංජිනේරුවකුගේ තත්ත්වය ලබා ගැනීම සඳහා එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සිලය විසින් නිර්දේශ කරනු ලැබ ඇති අධ්‍යයන අවශ්‍යතා සපුරාලනු පිණිස එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සිලය හෝ ඊට අනුබද්ධ ආයතනයකින් අදළ ඉංජිනේරු විෂයය පිළිබඳ පවත්වන ලද විභාගයේ සියලු කොටස් සම්පූර්ණ කර සමත් වී තිබීම;

හෝ

(ඈ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබා දෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් වෙනත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් මගින් පිරිනමනු ලැබූ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හා සමාන ඉංජිනේරු උපාධියක් ලබා තිබීම;

හෝ

(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් වෙතින් අදළ විෂයයන් (භෞතික විද්‍යාව/තාරකා විද්‍යාව/අභ්‍යවකාශ විද්‍යාව/භූ දත්ත සමීක්ෂණ විද්‍යාව (geomatic) ගණිතය හෝ අදළ ක්ෂේත්‍රයන්) පිළිබඳ ලබාගත් සිව් වසරක පූර්ණ කාලීන විද්‍යාවේදී උපාධියක් තිබීම;

සහ

අදාළ ක්ෂේත්‍රයෙහි පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ආචාර්ය උපාධියක් හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ වරලත් ඉංජිනේරුවෙකු සහ අධිසාමාජික (Fellow) ලෙස වෘත්තීය මට්ටමෙන් ලියාපදිංචි වී තිබීම. (CEng, FIESL);

සහ

ඉංජිනේරු/ විද්‍යාඥ ලෙස හෝ ඒ හා සමාන මට්ටමේ අත්දැකීම් සහිතව අවම වශයෙන් වසර 20ක සේවා පළපුරුද්දක් සතු විය යුතු අතර ඉන් වසර 05කට නොඅඩු කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක සේවය කර තිබිය යුතුය. තව ද, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ සමාගමක බහු විෂයානුබද්ධ කණ්ඩායම් සඳහා නායකත්වය ලබා දීම සහ මෙහෙයවීම සහ මානව සම්පත් සහ අනෙකුත් සම්පත් මනා ලෙස මෙහෙයවීමේ සහ කළමනාකරණය කිරීමේ සනාථ කළ හැකි දක්ෂතා සතු වීම;

2. (අ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) ප්‍රදර්ශනය කිරීම සඳහා පිළිගැනෙන, ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාලයක් විසින් පිරිනමනු ලැබූ, අදාළ ඉංජිනේරු විෂයයක් (ඉලෙක්ට්‍රොනික විද්‍යාව/ විදුලි සංදේශ හෝ අදාළ ක්ෂේත්‍රයක) පිළිබඳ සිව් වසරක, පූර්ණ කාලීන ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් සතු වීම;

හෝ

(ආ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගනු පිණිස සුදුසුකම් ලැබීමේදී ඒ සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් ඉහත කී ඉංජිනේරු විෂය ක්ෂේත්‍රය හා අදාළව පවත්වනු ලැබූ විභාගයේ සියලු කොටස් සම්පූර්ණ කොට සමත්ව තිබීම;

හෝ

(ඇ) වරලත් ඉංජිනේරුවකුගේ තත්ත්වය ලබා ගැනීම සඳහා එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සිලය විසින් නිර්දේශ කරනු ලැබ ඇති අධ්‍යයන අවශ්‍යතා සපුරාලනු පිණිස එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සිලය හෝ ඊට අනුබද්ධ ආයතනයකින් අදාළ ඉංජිනේරු විෂයය පිළිබඳව පවත්වන ලද විභාගයේ සියලු කොටස් සම්පූර්ණ කර සමත් වී තිබීම;

හෝ

(ඈ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබා දුන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් වෙනත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් මගින් පිරිනමනු ලැබූ, ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හා සමාන ඉංජිනේරු උපාධියක් ලබා තිබීම;

සහ

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙහි වරලත් ඉංජිනේරුවෙකු සහ සංස්ථානික සාමාජික (Coporate Member) ලෙස වෘත්තීය මට්ටමින් ලියාපදිංචි වී සිටීම. (C Eng, MIESL) හෝ එක්සත් රාජධානියේ (UK) ඉංජිනේරු කවුන්සිලයේ වරලත් ඉංජිනේරුවෙකු ලෙස සහ එක්සත් රාජධානියේ වෘත්තීය ඉංජිනේරු ආයතනයක අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ සංස්ථානික සාමාජික (Coporate Member) ලෙස වෘත්තීය මට්ටමින් ලියාපදිංචිව සිටීම.

සහ

ඉංජිනේරුවෙකු ලෙස හෝ ඒ සමාන මට්ටමේ අත්දැකීම් සහිතව අවම වශයෙන් වසර 02ක සේවා පළපුරුද්දක් සතු විය යුතු අතර ඉන් වසර 10කට නොඅඩු කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක සේවය කර තිබිය යුතුය. තවද රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ සමාගමක බහු විෂයානුබද්ධ කණ්ඩායම් සඳහා නායකත්වය ලබා දීම සහ මෙහෙයවීම සහ මානව සම්පත් හා අනෙකුත් සම්පත් මනාව මෙහෙයවීමේ සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීමේ සනාථ කළ හැකි දක්ෂතා සතු වීම.

*සැ. යු.* - ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පිළිගත් පශ්චාත් උපාධියක් සහිත අපේක්ෂයකයින්ට ප්‍රමුඛතාවය ලැබේ.

අභ්‍යන්තර :

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමණාකරණ (HM 2-2) කාණ්ඩයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ මෙහෙයුම්/ සැලසුම් සහ සංවර්ධන/ අභ්‍යවකාශ තාක්ෂණය සහ යෙදවුම්) තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

සහ

බහු විෂයානුබද්ධ කණ්ඩායම් සඳහා නායකත්වය ලබා දීමේ සහ මෙහෙයවීමේ සනාථ කළ හැකි දක්ෂතා සහ මානව සම්පත හා වෙනත් සම්පත්හි කාර්යක්ෂම කළමනාකරණය පිළිබඳ අත්දැකීම් සතුවී තිබීම.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 සැප්තැම්බර් මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අගෝස්තු මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

සැ. යු.- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් සහිත අපේක්ෂයකයින් සඳහා ප්‍රමුඛතාවය ලැබේ.

*වයස* :- වයස අවුරුදු 35ට නොඅඩු විය යුතු අතර වයස අවුරුදු 55 නොඉක්මවිය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා බල නොපානු ඇත.

වෙනත් :

සියලු අයදුම්කරුවන්,

i. ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
ii. තනතුරෙහි රාජකාරීන් මනා ලෙස ඉටුකිරීම සඳහා සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කරනු ලැබීම පිණිස කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

වෙනත් ප්‍රතිලාභ :

(අ) සේවක අර්ථසාධක අරමුදල - සේවකයින් 10%ත නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය 15%.
(ආ) සේවක භාරකාර අරමුදල - නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය 3%
(ඇ) අදාළ වෘත්තීය ආයතනයන්හි සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය.
(ඈ) නියම කරනු ලැබූ සීමාවන් තුළ, නේවාසික/බාහිර ප්‍රතිකාර ආවරණය කෙරෙන වෛද්‍ය යෝජනා ක්‍රම.
(ඉ) රජයේ රෙගුලාසිවලට අනුකූල වන පරිදි නිල වාහන පහසුකම් ලබා දීම.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය - 2018.09.30.

අයදුම් කිරීමේ ක්‍රමය :

රාජ්‍ය දෙපාර්තමේන්තු/සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල නිලධාරීන්, සිය ප්‍රධානීන් හරහා සිය අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. සම්පූර්ණ ජීවදත්ත සටහන, අදාළ සහතිකවල ඡායාපිටපත් සමග ඥාතිත්වයක් නොමැති නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපින සඳහන් කරන ලද අයදුම්පත් 2018 සැප්තැම්බර් 03 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන දේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන ලියුම් කවරය වම්පස ඉහළ කෙළවරේ " අධ්‍යක්ෂක ජනරාල් තනතුර ( නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය)" යනුවෙන් සඳහන් කළ යුතු ය.

ලේකම්,
විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ,
නිපුණතා සංවර්ධන හා
වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය.

03 වන මහල,
සෙත්සිරිපාය - I අදියර,
බත්තරමුල්ල.

08-1165

---

# විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

**කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018**

**First Efficiency Bar Examination for Woman Development Officers of Ministry of Women and Child Affairs -2018**

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2018 දෙසැම්බර් මස කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය සඳහා ඉල්ලුම්පත්‍ර භාරග න්නා අවසාන දිනය 2018.09.21 බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. *විභාග පරිපාටිය* :- මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත. මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| | |
|---|---|
| විෂයය අංක 01 :- මුදල් රෙගුලාසි / කාර්යාල ක්‍රම | - කාලය පැය 02 යි. ලකුණු 100 |
| විෂයය අංක 02 :- ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම් | - එම |
| විෂයය අංක 03 :- සමාජ විද්‍යාව හා මනෝවිද්‍යා උපදේශනය | - එම |

*සටහන* :-

(*අ*) සියලුම විෂයයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වශයෙන් වාර කිහිපයකදී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර ඇත.
(*ආ*) සාමාර්ථ්‍ය සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකින්ම ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත යුතුය.
(*ඇ*) සෑම ප්‍රශ්න පත්‍රයක්ම අනිවාර්යෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න වලින් සමන්විත වේ.

03. *විෂයයන්* : (ව්‍යුහගත ප්‍රශ්න පත්‍ර තුනකින් සමන්විත වේ.)

03.01 මුදල් රෙගුලාසි / කාර්යාල ක්‍රම :
ශ්‍රී ලංකාවේ රාජ්‍ය කළමනාකරණ ව්‍යුහය
මූල්‍ය පාලනය හා වාර්ෂික ඇස්තමේන්තු
ආයතන සංග්‍රහයේ නියෝග හා මුදල් රෙගුලාසි
ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද ආවරණය කරනු ලැබේ.
I, II, IV, V, VII, IX, XII, XV, XXIII, XXVI, XXVII, XXX, XXXI, XXXII, XXXIII පරිච්ඡේද, ආණ්ඩුවේ මුදල් රෙගුලාසි I වන කාණ්ඩය (X පරිච්ඡේදය හැර)

කාර්යාල කළමනාකරණය

03.02. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම් :
කාන්තාවන්ට එරෙහි වෙනස්කම් කිරීම
ශ්‍රී ලාංකික සමාජයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය
ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තිය හා කාන්තා හිමිකම්

03.03 සමාජ විද්‍යාව හා මනෝ විද්‍යා උපදේශනය :
ග්‍රාමීය සමාජ විද්‍යාව
ශ්‍රී ලංකාවේ නාගරීකරණය
ග්‍රාම සංවර්ධනය
මනෝවිද්‍යා උපදේශනයේ මූලික ලක්ෂණ හා ආචාරධර්ම
ස්ත්‍රිය සහ මානසික අක්‍රමිකතා
ශ්‍රී ලංකාවේ උපදේශන ව්‍යාපාරය සහ උපදේශන අවස්ථා

04. මෙම පරීක්ෂණය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ ඉල්ලුම්පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. එම ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුව අපේක්ෂකයන් විසින් ස්වකීය ඉල්ලුම්පත්‍ර පිළියෙල කර ගත යුතුය. ඉල්ලුම්පත්‍ර පිළියෙල කර ගත යුත්තේ ඒ4 ප්‍රමාණයේ කඩදාසියක අංක 01 සිට 06 තෙක් මුල් පිටුවේ ද, සෙසු කොටස් අනෙකුත් පිටුවලට ද වන ලෙසය. එය සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විසින් සිය අත් අකුරිනි.

ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතු වේ.

විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථාන විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, ඉල්ලුම්පත්‍ර එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

නිවේදනයේ ඇතුළත් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට ඉල්ලුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර ඉල්ලුම් පත්‍රයට ඇතුලත් කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් විමසිලිමත් විය යුතුය. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

05. ඉල්ලුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි නම්, ප්‍රාදේශීය ලේකම් මගින්) 2018.09.21 දින හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල් , සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළයුතු ය. විභාගය සඳහා ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට පසුව ලැබෙන හා අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්යය සඳහා නව ප්‍රවේශක නිළධාරින් විසින් තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍ය අනුව දෙමළ භාෂාවෙන් / ඉංග්‍රීසි භාෂාවෙන් හෝ පිළියෙල කොට ඉදිරිපත් කළ හැකිය.

06. (i) අයදුම්රුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම්, එම ගාස්තුව ගෙවීමෙන් ලද කුවිතාන්සියේ ඡායා පිටපත අතැතිව, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ඔබගේ ඉහත විස්තර හා විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත.

(ii) අපේක්ෂකයින් විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර, විභාගයට පෙනී සිටින පළමු දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

(iii) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

07. *අනන්‍යතාව*.-අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් කුමක් වුවත් භාර ගැනේ.

(i) පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රය).

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම හෝ නොපිළිගැනීමට හෝ විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

08. *විභාග ගාස්තු*.-මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අය කෙරේ.

| *විභාග ගාස්තු* | *රු. ශ.* |
|---|---|
| (*අ*) පළමුවන වතාව සඳහා ගාස්තු අය නොකෙරේ | - |
| (*ආ*) පළමුවන වතාවෙන් පසු සම්පූර්ණ විභාගය සඳහා | 500.00 |
| (*ඇ*) එක් විෂයක් සඳහා | 250.00 |

විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උපතැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීම් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදුකරනු නොලැබේ. විභාග ගාස්තු ගෙවන ලද ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් කෙරේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට අපේක්ෂකයින්ට සිදුවනු ඇත.

(ii) විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය, ලේකම්, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත.

10. මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර ඇති තමන්ගේ දෙපාර්තමේන්තු / කාර්යාලවල නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා දෙපාර්තමේන්තු / කාර්යාල ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබා දිය යුතුය.

11. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ඇත.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ලේකම්,
කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය.

2018.08.16 වැනි දින,
කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය,
5 වන මහල,
සෙත්සිරිපාය, 2 වන අදියර,
බත්තරමුල්ල.

ආදර්ශ ඉල්ලුම්පත්‍රය

**කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018**

**First Efficiency Bar Examination for Woman Development Officers of Ministry of Woman and Child Affairs -2018**

විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍ය
සිංහල - 2
දෙමළ - 3
(අදාළ කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——————.
(*උදා* : HERATH MUDIYANSLAGE SMAN KUMARA GUNAWARDHAN ) :-

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :——————.
(*උදා* : GUNAWARDHANA. H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :——————.

02. 2.1 කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————————.
2.2 කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :————————.
2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————————.
2.4 දුරකතන අංකය :————————.

03. 3.1 ස්ත්‍රී / පුරුෂ භාවය :- පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ස්ත්‍රී - 1

3.2 උපන් දිනය :-
වර්ෂය : මාසය : දිනය :

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය (2018.09.21) ට වයස :-
අවු. : මාස : දින :

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරි තනතුරට පත් වූ දිනය :————————.
(නිත්‍ය වශයෙන් රාජකාරී භාරගත් දිනය සඳහන් කළ යුතුයි.)

06. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදි ප්‍රවේශකයෙක් ද? :————————.
නැතහොත් නව ප්‍රවේශකයෙක් ද?

දෙපාර්තමේන්තුවේ නම (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් නම් එහි නම) :————————.
*ගැසට්* නිවේදනයේ 2 වන ඡේදය යටතේ ඉදිරිපත් වන විෂයයන් හා විෂය අංක :-

| *විෂයය* | *විෂයය අංකය* |
|---|---|
| 1. ................................................................ | |
| 2. ................................................................ | |
| 3. ................................................................ | |

09. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද?

10. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය :-
(i) විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :————————.
(ii) ලදුපත් අංකය හා දිනය :————————.
(iii) ගෙවූ දිනය :————————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. (ඡායා පිටපතක් ළග තබා ගන්න)

11. ඉහත සඳහන් විස්තර නිවැරදි බවද, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවද ප්‍රකාශ කරමි. තවද විභාග කොමසාරිස් ජනරාල් විසින්, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය : ..........................................

..........................................................,
අයදුම්කරුගේ අත්සන

*සටහන :* අයදුම්කරු තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අත්සන් කල යුතුය.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරිනියක වූ, මා පෞද්ගලිකව දන්නා හඳුනන ........................................................................................ ........ මිය / මෙනවිය ........................................................................ වන දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

නම : ..............................................

තනතුර : ........................................

ලිපිනය : ........................................

.........................................................,
සහතික කරන්නාගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත සපයා ඇති විස්තරය පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා එම ලදුපත අලවා ඇති බවත් අයදුම්කරු/අයදුම්කාරිය ප්‍රථම වතාවට මෙම විභාගයට පෙනී සිටින බවත්, අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

..................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

(නිල මුද්‍රාව තැබිය යුතුය)

නම : ..................................................
පදවි නාමය : .......................................
ලිපිනය : ............................................
දිනය : ...............................................
(අනවශ්‍ය වචන කපා හරින්න)

08 - 1196

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

රත්මලාන අංගනයේ ඇති මෙට්‍රික් ටොන් 2000 ක ගර්හිත වානේ/යකඩ සුන්බුන් බැහැරලීම

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7573

කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) හි සභාපති විසින්, රත්මලාන, දුම්රිය අංගනයේ ඇති ගර්හිත වානේ/යකඩ සුන්බුන් (ආසන්න වශයෙන්) මෙට්‍රික් ටොන් 2000 ක් බැහැරලීම සඳහා මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2018.08.31 වැනි දින ප.ව. 2.00 ට අවසන් වනු ඇත.

03. ලංසු, දුම්රිය සේවයේ, ප්‍රධාන මුල්‍ය නිලධාරී කාර්යාලයේදී ගෙවිය යුතු, ආපසු ගෙවනු නොලබන ගාස්තුවක් වන ශ්‍රී ලංකා රුපියල් දොළොස්දහස් පන්සියයක (රු.12,500) ක පමණක් වන මුදලක් ගෙවීමෙන් හා 2018.08.09 වැනි දින සිට 2018.08.30 වැනි දින දක්වා සාමාන්‍ය රාජකාරි දිනවල දී, පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා ශ්‍රීලංකාවේ, කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මත පමණක් ඉදිරිපත් කළ යුතුය.

04. ලංසු, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී, එම ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට පැමිණ සිටින ලෙස, ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම සිදුකළ යුතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය, ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන දුම්රිය ගබඩා කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

වැඩිදුර විස්තර සඳහා විමසන්න :
දුරකථන අංක : 2438078/2436818,
ෆැක්ස් : 2432044,
ඊමේල් : srs.slr@gmail.com

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7573

08-900

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**කොළඹ, දුම්රිය අංගනයේ ඇති ගර්හිත වැගන් අපහරණය කිරීම**

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7486

01. කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මුලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) හි, සභාපති විසින් කොළඹ දුම්රිය අංගනයේ හි පවතින ගර්හිත දුම්රිය වැගන්/ගැල් අපහරණය කිරීම සඳහා මුද්‍රා, තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. ලංසුභාර ගැනීම 2018.08.28 වැනි දින පස්වරු 2.00ට අවසන් වේ.

03. ලංසු, දුම්රිය සේවයේ ප්‍රධාන මුල්‍ය නිලධාරි කාර්යාල වෙත ගෙවිය යුතු, ආපසු ගෙවනු නොලබන රුපියල් 5,000 ක ලේඛන ගාස්තුවක් ගෙවීමෙන් (රුපියල් පන්දහසක් පමණක්) ඉක්බිති 2018.08.27 වැනි දින ප.ව. 3.00 දක්වා කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මත පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

04. ලංසු එම ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට පැමිණ සිටින ලෙස ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් හට ආරාධනය කරනු ලැබේ.

05. මුද්‍රා තැබූ ලංසු පහත ලිපිනයට ලේඛනගත තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාර දීම හෝ සිදුකළ යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කට් මාවත,
කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි ය.

07. වැඩිදුර විස්තර සඳහා කරුණාකර, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ, දුම්රිය ගබඩා අධිකාරි වෙතින් විමසනු මැනවි.

දුරකථන අංකය : 011-2438078/2436818
ෆැක්ස් : 011-2432044
යොමු අංකය SRS/F. 7486

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

08-898

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**රත්මලාන දුම්රිය අංගනයෙහි පවත්නා ගර්හිත රේඩියේටර්, ඉවත දැමූ කොයිල් ස්ප්‍රිං, ඇලුමිනියම් සුන්බුන් හා ගර්හිත රෝද හා ඇක්සල් බැහැර කිරීම**

SRS/F. 7580

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් රත්මලාන දුම්රිය අංගනයෙහි තබා ඇති ගර්හිත රේඩියේටර් මෙ/ටොන් 30ක්, ඉවත දැමූ කොයිල් ස්ප්‍රිං මෙ/ටොන් 50ක්, ඇලුමිනියම් සුන්බුන් මෙ/ටොන් 25 ක් ගර්හිත සහ රෝද හා ඇක්සල් මෙ/ටොන් 500ක් බැහැර කිරීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. මෙහි සඳහන් අයිතම සියල්ලම හෝ ඕනෑම ගණනක් සඳහා හෝ ලංසු භාර ගනු ලබන අතර, එක් එක් අයිතමයක් සඳහා ලැබෙන ලංසු වෙන් වශයෙන් අගැයුම් කොට ප්‍රදානය කිරීම සිදු කෙරෙනු ඇත.

02. ලංසුභාර ගැනීම 2018.09.04 දින පස්වරු 2.00ට අවසන් කරනු ලැබේ.

03. ආපසු ගෙවනු නොලබන ලේඛන ගාස්තු, ශ්‍රී ලංකා රුපියල් දස දහසක් (රු. 10,000) ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මුල්‍ය නිළධාරි කාර්යාලය වෙත ගෙවීමෙන්, 2018.08.10 දින සිට 2018.09.03 වැනි දින දක්වා සාමාන්‍ය රාජකාරි දිනවල, පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ ශ්‍රී ලංකාවේ, කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

04. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටීමට අවසර ඇත.

05. මුද්‍රා තැබූ ලංසු ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් බාරදීමෙන් පහත සඳහන් අය වෙත ලැබීමට සැලස්විය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කොට් මාවත,
කොළඹ 10.

06. දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ගෙවීමකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැක. වැඩිදුර විස්තර සඳහා අමතන්න.

දුරකථන අංක : 2438078/2436818
ෆැක්ස් : 2432044
ඊමේල් : srs.slr@gmail.com

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7580

08-899

**මහාධිකරණය - පොළොන්නරුව**

රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම

මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද වාහන ටෙන්ඩර් කැඳවා විකිණීමට පොළොන්නරුව මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත. විකිණීමට අදාළ මෝටර් වාහන පහතින් දක්වා ඇති ස්ථානයේ දී 2018.08.24 වැනි දිනට පසු අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර් මගින් පරීක්ෂා කිරීමට හැකියාව ඇත.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | පරීක්ෂා කළ හැකි ස්ථානය | පරීක්ෂා කිරීම සඳහා අවසර ලබාගත යුතු නිලධාරියා |
|---|---|---|---|---|
| 01 | 91547 | ලියාපදිංචි අංක NCRA 6505 වැනේ වර්ගයේ ට්‍රැක්ටර් රථය | සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය, මනම්පිටිය. | රෙජිස්ට්‍රාර්, දිසා මහේස්ත්‍රාත් අධිකරණය, පොළොන්නරුව. |
| 02 | 91549 | ලියාපදිංචි අංක NCRC 4638 වැනේ වර්ගයේ ට්‍රැක්ටර් රථය | සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය, මනම්පිටිය. | රෙජිස්ට්‍රාර්, දිසා මහේස්ත්‍රාත් අධිකරණය, පොළොන්නරුව. |

01. ටෙන්ඩර් ලියකියවිලි පොළොන්නරුව, මහාධිකරණය මගින් 2018.08.24 වැනි දින සිට 2018.09.06 දක්වා නිකුත් කරනු ලැබේ.
02. ලංසු භාර ගැනීම 2018.09.11 දින ප.ව. 12.30 න් අවසන් වේ.
03. ආපසු නොගෙවන ලද රු. 200.00 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් හා ආපසු ගෙවන ලද රු. 7,000.00 ක ටෙන්ඩර් තැන්පතු මුදලක් ටෙන්ඩර් පෝරම ලබා ගන්නා අවස්ථාවේ දී පොළොන්නරුව මහාධිකරණයට ගෙවිය යුතුය.
04. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම 2018.09.11 ප.ව. 01.00 ට පොළොන්නරව මහාධිකරණයේ විවෘත අධිකරණ පරිශ්‍රයේ දී ලංසුපත් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට පැමිණ සිටින ලෙස ලංසුකරුවන්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.
05. ලංසුපත් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය ටෙන්ඩර් මණ්ඩලය සතු වේ.
06. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම - 2018" යනුවෙන් සඳහන් කළ යුතුය.
07. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාර දීම කළ යුතු ය.

සභාපති,
මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව,
මහාධිකරණය - පොළොන්නරුව.

2018 ජූලි මස 30 වැනි දින,
පොළොන්නරුව මහාධිකරණයේ දී ය.

08-756

## බඩු බාහිරාදිය විකිණීම්

**සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - කළුවංචිකුඩි**

කළුවංචිකුඩි සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණ නඩු විභාගවලදී අත්පත් කර රාජසන්තක කරන ලද පහත සඳහන් භාණ්ඩ 2018.09.15 වැනි දින පස්වරු 9.30 ට කළුවංචිකුඩි සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසි කිරීමට නියමිතය.

කළුවංචිකුඩි සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින පෙ.ව. 8.30 සිට ප.ව. 9.30ට දක්වා අතර කාලය තුළ පහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩවල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් මෙම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත් කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේ දී ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ අධිකරණ පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට පියවර ගත යුතු අතර මෙහිදී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාර ගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳව කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසි සිදුකරන අවස්ථාවේදීම ඉදිරිපත් කළයුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගි වීමට කැමති අය සිය ජාතික හැඳුනුම්පත හෝ පිළිගතහැකි ලේඛන සමග පැමිණිය යුතු ය.

කේ. ජීවරාණි,
මහෙස්ත්‍රාත්,
සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය,
කළුවංචිකුඩි.

2018 ජූලි මස 31 වැනි දින.

**ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ විස්තරය**

| අංක | නඩු අංකය | ලියාපදිංචි අංකය | භාණ්ඩ |
|---|---|---|---|
| 01. | 15911/MT/15 | EP GU-8301 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) |
| 02. | 1129/PC/11 | EP GR-0047 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) |
| 03. | 19900/MT/17 | EP UC-3593 | යතුරු පැදිය |
| 04. | B/163/16 | EP MS-3659 | යතුරු පැදිය |
| 05. | B/363/15 | EP BAQ-0932 | යතුරු පැදිය |
| 06. | 15122/E/15 | EP VU-1099 | යතුරු පැදිය |
| 07. | 14294/MT/14 | WP HL-2630 | යතුරු පැදිය |
| 08. | 1679/11 | EP JS-0029 | යතුරු පැදිය |
| 09. | AR/05/15 | EP GU-3170 | යතුරු පැදිය |
| 10. | AR/1110/14 | Ep XV-7323 | යතුරු පැදිය |
| 11. | 15625/MT/15 | EP XU-6667 | යතුරු පැදිය |
| 12. | 18872/MT/15 | 157-4077 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) |
| 13. | 7757/E/13 | EP MG-1042 | යතුරු පැදිය |
| 14. | 7872/E | EP US-1003 | යතුරු පැදිය |
| 15. | B/794/12 | 36-2334 | ට්‍රැක්ටර් (අමතර කොටස් පමණි) |
| 16. | Unknown No. | BBB-3423 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) |
| 17. | 10751/PC/13 | ලියාපදිංචි නැති | ටේලරය (අමතර කොටස් පමණි) |
| 18. | B/760/12 | ලියාපදිංචි නැති | යතුරු පැදිය (අමතර කොටස් පමණි) |
| 19. | B/794/12 | ලියාපදිංචි නැති | ටේලරය (අමතර කොටස් පමණි) |
| 20. | 18874/MT/17 | ලියාපදිංචි නැති | යතුරු පැදිය (අමතර කොටස් පමණි) |
| 21. | AR/507/17 | EP MG-5419 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) |

08-744

**දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණය - පුත්තලම**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා නඩු අංක සොයා ගත නොහැකි සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම හා කාර්යාලයේ පාවිච්චියෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පුත්තලම මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුවල හා පුත්තලම අධිකරණය මගින් පවත්වනු ලබන කල්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ හා 2016.01.01 දිනට පෙර පවත්වනු ලැබූ ආණමඩුව සංචාරක අධිකරණවල පවරන ලද නඩු වලට අදාලව රාජසන්තක කරන ලද හා නඩු අංක සොයා ගත නොහැකි සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ සහ කාර්යාලයේ පාවිච්චියෙන් ඉවත් කරන ලද පහත සඳහන් භාණ්ඩ 2018 සැප්තැම්බර් මස 29 වැනි සෙනසුරාදා දින පෙ.ව. 9.30ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන්නේ නම්, වෙන්දේසිය පවත්වන දිනයේ දී වෙන්දේසිය පැවැත්වීමට පැයකටවත් කලින් රෙජිස්ට්‍රාර්වරයා වෙත හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර වෙන්දේසියේ විකිණීමට සුදානම් කර ඇති ද්‍රව්‍යයන් පරීක්ෂා කළ හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හී දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා එවේලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.සියළුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර චෙක්පත් හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගන්නා සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර, මිලදී ගන්නා සියළුම භාණ්ඩ එදිනම පස්වරු 4.00ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

බී. ඒ. ඒ. අයි. බුද්ධදාස,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත් - පුත්තලම.

2018 අගෝස්තු මස 06 වැනි දින,
පුත්තලම දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසියට අදාල නඩු භාණ්ඩ පිළිබඳ විස්තර වාර්තාව**

| අනු. අංකය | නඩු අංකය | ලි.ප. අංකය | චැසි අංකය | එන්ජින් අංකය | විස්තරය |
|---|---|---|---|---|---|
| 01. | 37391 | - | - | - | අත්ට්‍රැක්ටර් ටේලරය ලියාපදිංචි කළ නොහැකි අබලි |
| 02. | අංක රහිත | - | - | - | අත් ට්‍රැක්ටර් ටේලරය ලියාපදිංචි කල නොහැකි අබලි |
| 03. | 05093/14 | - | - | - | ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටර් ටේලරය |
| 04. | 67153/12 | - | - | - | Agrotech වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය සහ ටේලරය |
| 05. | 29465 | - | 2755 | - | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය සහ ටේලරය |
| 06. | 26555 | - | - | - | ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 07. | 37391 | - | - | - | SINGER වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 08. | 1391 | - | - | - | ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 09. | 67153/12 | - | 10204 | 10204 | Agrotec වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 10. | 00579/14 | SK 2039 | - | - | Agrotec වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය හා ටේලරය |
| 11. | අංක රහිත | - | - | - | Kubota වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 12. | අංක රහිත | - | 1499 | 1548 | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අත් ට්‍රැක්ටරය සහ ටේලරය |
| 13. | අංක රහිත | - | 17055 | 17055 | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 14. | අංක රහිත | - | RV 52930 | 52930 | ULKYNO වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අත් ට්‍රැක්ටරය |
| 15. | 69157 | - | - | - | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය සහ ටේලරය |
| 16. | 70982/12 | SI - 5225 | SSW - 2125 | SSW 2125 | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය සහ ටේලරය |
| 17. | අංක රහිත | - | - | - | UNIMO වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 18. | අංක රහිත | - | 5134 | SIR 5134 | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය සහ ටේලරය |
| 19. | 24290 | - | - | - | KUBOTA වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය සහ ටේලරය |
| 20. | 70982/12 | - | 13992 | - | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |

| අනු. අංකය | නඩු අංකය | ලි.ප. අංකය | චැසි අංකය | එන්ජින් අංකය | විස්තරය |
|---|---|---|---|---|---|
| 21. | AR/148/08 | - | - | - | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 22. | අංක රහිත | - | - | - | KUBOTA වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 23. | අංක රහිත | SJ - 7040 | SPD - 0248 | SPD - 0248 | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 24. | 05093/14 | - | ATL 0301 | - | Agrotec වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 25. | අංක රහිත | 71-0334 | 7684 | - | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 26. | PR 1125/17 | - | 0129526 | AS 080625 | Rarmmaster වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 27. | අංක රහිත | - | - | - | ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටර් ටේලරය |
| 28. | අංක රහිත | - | - | - | අත් ට්‍රැක්ටර් ටේලරය ලියාපදිංචි කළ නොහැකි අබලි |
| 29. | අංක රහිත | - | - | - | අත් ට්‍රැක්ටර් ටේලරය ලියාපදිංචි කළ නොහැකි අබලි |
| 30. | අංක රහිත | - | OP00089 | OP00089 | SIFANG අත් ට්‍රැක්ටරය සහ ලියාපදිංචි කළ නොහැකි ටේලරය |
| 31. | අංක රහිත | - | - | - | ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටර් ටේලරය |
| 32. | 48595 | - | - | - | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 33. | 00706/14 | - | 8320 | 3393 | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 34. | PR 81/14 | - | 4140 | 1230 | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 35. | අංක රහිත | - | - | - | ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටර් ටේලරය |
| 36. | අංක රහිත | - | - | - | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 37. | 83127/13 | NW-SE - 2078 | UEL 4395 | - | UNIMO වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |
| 38. | 16963 | SH - 3011 | DF-81BL /003200/2007 | 338034 | Agrimec වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි අත් ට්‍රැක්ටරය |

08-775

---

මහෙස්ත්‍රාත් අධිකරණය - වලපනේ

## අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වලපනේ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොපාන ලද භාණ්ඩ 2018.09.29 වැනි දින පෙ.ව. 9.30 ට අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබව බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්ගේ පූර්ණ අවසරය මත වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට කළින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනුන අවස්ථා වලදී අධිකරණයේ අභිමතය පිරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු වේ.

05. වෙන්දේසියේදී මිළදී ගනු ලබන භාණ්ඩ එවේලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියළුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිළදී ගන්නා සෑම අයෙකුම තම අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

එස්. එල්. එම්. විජේසිංහ,
දිසා විනිසුරු/ මහෙස්ත්‍රාත්,
වලපනේ.

2018 ක් වූ ජූලි මස 30 වැනි දින,
වලපනේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | ඒ. ආර්/1117/17 | කෑන් | 01 |
| 02 | ඒ.ආර්/1117/17 | දෙකෙළවර රබර් නල යෙදූ තඹ දඟර | 01 |
| 03 | ඒ.ආර්/1117/17 | වාඩි බැරල් | 01 |
| 04 | 72002/17 පී.ආර්/454/17 | යකඩ මිට සහිත සවල් | 02 |
| 05 | 70487/17 | ප්ලාස්ටික් කෑන් | 01 |
| 06 | 70487/17 | ලා නිල් පාට බූලි | 01 |
| 07 | බී/43/18 | අලවංගු | 02 |
| 08 | බී/43/18 | කුළුගෙඩි | 01 |
| 09 | 72068/17 | ටෝච් (විදුලි පන්දම්) | 01 |
| 10 | 72069/17 | විදුලි පන්දම් | 01 |
| 11 | 72879 | සවල් | 02 |
| 12 | 72916 | මීටර් 05 දිග ටේප් පටි | 01 |
| 13 | 72914 | මීටර් 05 දිග ටේප් පටි | 01 |
| 14 | 72913 | මීටර් කෝදු | 01 |
| 15 | 72917 | මීටර් කෝදු | 01 |
| 16 | 68872 (බී/324/15) | පොරව තල | 01 |
| 17 | 70917 | විදුලි පන්දම් | 01 |
| 18 | (බී/396/16) | පිහි | 01 |
| 19 | 67788 (බී/657/15) | වක්පිහි | 01 |
| 20 | 72915 | මීටර් කෝදු | 01 |
| 21 | 73632 | සවල් | 01 |
| 22 | 73366 | කළු පාට ඉටි කවර | 01 |
| 23 | 73528 | පූනීල | 01 |
| 24 | 73528 | ඇළුමිනියම් කරඩි | 01 |
| 25 | 73523 | පුනීල | 01 |
| 26 | 73527 | පුනීල | 01 |
| 27 | 73527 | ඇලුමිනියම් කරඩි | 01 |
| 28 | 73526 | පුනීල | 01 |
| 29 | 73526 | ඇලුමිනියම් කරඩි | 01 |
| 30 | 73525 | පුනීල | 01 |
| 31 | 73525 | ඇලුමිනියම් කරඩි | 01 |
| 32 | 73524 | ඇලුමිනියම් කරඩි | 01 |
| 33 | 68307 | ටිවී | 01 |
| 34 | 68307 | බෆල් | 01 |
| 35 | 68307 | සී.ඩී.එම්.ඒ. දුරකථන | 01 |
| 36 | 73660 | කොළපැහැති වීල් බැරෝ | 01 |
| 37 | 73660 | බාල්දි | 01 |
| 38 | 73660 | උදළු | 01 |
| 39 | 53566 (බී/344/13) | යකඩ සවල් | 04 |
| 40 | 53566 (බී/344/13) | තාච්චි | 01 |
| 41 | 53566 (බී/344/13) | ලී මිට සහිත උදළු | 01 |
| 42 | 73710 | තට්ටු තරාදි | 01 |
| 43 | 73710 | වක් පිහි | 01 |
| 44 | 73617 | නිල් පැහැති ප්ලාස්ටික් කෑන් | 01 |
| 45 | 73618 | නිල් පැහැති ප්ලාස්ටික් කෑන් | 01 |
| 46 | 73619 | නිල් පැහැති ප්ලාස්ටික් කෑන් | 02 |
| 47 | 69276 | ජංගම දුරකථන | 01 |
| 48 | 69765 (බී/697/16) | ජංගම දුරකථන | 01 |
| 49 | ඒ.ආර්/474/17 | සී.ජේ.පී. 1687 දරන යතුරු පැදි | 01 |
| 50 | ඒ. ආර්./447/11 | 142-0086 හොන්ඩා වර්ගයේ යතුරු පැදි | 01 |
| 51 | 70067 | උදළු මුල්ලු | 01 |
| 52 | 40851 | සවල් | 01 |
| 53 | 72671 | මයික්‍රොකොරිස් වර්ගයේ දරමිටි | 01 |
| 54 | 72620 | කෝටු (03 වන පන්තියේ) කුඩුදවුල, බෝඹු, අංකෙන්ද, දඹ | 300 |
| 55 | 67390 (බී/690/14) | ජංගම දුරකථන | 01 |
| 56 | අංක රහිත | අත් ට්‍රැක්ටර් ටේලර් කොටස | |
| 57 | අංක රහිත | අබලන් තත්ත්වයේ ඇති ඉරුම් පට්ටල් (යකඩ ප්‍රේම්) | 01 |
| 58 | අංක රහිත | වැලි තොගය | |
| 59 | අංක රහිත | විවිධ ප්‍රමාණයේ හිස් බෝතල් | |
| 60 | අංක රහිත | විවිධ ප්‍රමාණයේ ප්ලාස්ටික් කෑන් | |
| 61 | 70651 | තඹ දඟර | 01 |
| 62 | 57024 | තඹ දඟර | 01 |
| 63 | 70784 | තඹ දඟර | 01 |
| 64 | 70963 | තඹ දඟර | 01 |
| 65 | 71691 | තඹ දඟර | 01 |
| 66 | 58756 | පිහි | 01 |
| 67 | 65847 | පිහි | 01 |
| 68 | ඒ.ආර්/92/09 | පිහි | 01 |
| 69 | 68653 | පිහි | 01 |
| 70 | බී/43/18 | කළු ගල් තොගය | |
| 71 | - | අධිකරණ භූමියේදී සුළඟට කඩා වැටී ඇති ගස් වල කොටස් | |

**2017 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ මත කාර්යාලීය භාවිතයෙන් පසු ඉවත් කරන ලද භාණ්ඩ**

| | | |
|---|---|---|
| 72 | ග්ලාස් පෑඩ් (කැඩී ඇත) | 02 |
| 73 | බංකු (ඇඳි සහිත) (කැඩී ඇත) | 02 |
| 74 | පුටු (සාමාන්‍ය) (කැඩී ඇත) | 04 |
| 75 | කී බෝඩ් (ක්‍රියා විරහිත වී ඇත) | 03 |
| 76 | ප්‍රින්ටර් (ක්‍රියා විරහිත වී ඇත) | 02 |
| 77 | අල්මාරි (වානේ) අබලන් | 01 |
| 78 | පරිගණක මූසික (ක්‍රියා විරහිත වී ඇත) | 01 |
| 79 | විදුලි පන්දම් (ක්‍රියා විරහිත වී ඇත) | 01 |

08-742

### සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - එරාවූර්

එරාවූර් සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණ නඩු විභාගවලදී අත්පත් කර රාජසන්තක කරන ලද පහත සඳහන් භාණ්ඩ 2018.09.16 වැනි දින පෙරවරු 9.30 ට එරාවූර් සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසි කිරීමට නියමිතය.

එරාවූර් සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණ රෙජිස්ටාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින පෙ.ව. 8.30 සිට පෙ.ව. 9.30 දක්වා අතර කාලය තුළ පහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩවල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් මෙම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත් කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේදී ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ අධිකරණ පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට පියවර ගත යුතු අතර මෙහිදී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාර ගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳව කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසි සිදුකරන අවස්ථාවේදීම ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගිවීමට කැමති අය සිය ජාතික හැඳුනුම්පත හෝ පිළිගතහැකි ලේඛන සමග පැමිණිය යුතුය.

කේ. ජීවරාණි,
මහෙස්ත්‍රාත්,
සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය,
එරාවූර්.

2018 ජූලි මස 31 වැනි දින.

**ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ විස්තරය.**

| අංක | නඩු අංකය | ලියාපදිංචි අංකය | භාණ්ඩ |
|---|---|---|---|
| 01 | AR/536/12 | EP ME - 6887 | යතුරු පැදිය |
| 02 | 7570/E/13 | EP XP - 7936 | යතුරු පැදිය |
| 03 | 8925/E/13 | EP JV - 2233 | යතුරු පැදිය |
| 04 | 12522/Misc/13 | EP VZ - 3953 | යතුරු පැදිය |
| 05 | AR/910/16 | EP MA - 6469 | යතුරු පැදිය |
| 06 | 24112/Misc/17 | EP HD - 4000 | යතුරු පැදිය |
| 07 | 10937/E/13 | ලියාපදිංචි නැති | යතුරු පැදිය (අමතර කොටස් පමණි) |
| 08 | 19410/Misc/15 | ලියාපදිංචි නැති | ටේලරය (අමතර කොටස් පමණි) |
| 09 | 8806/F/13 | EP GG - 6892 | අත් ට්‍රැක්ටර් සහිත ටේලරය (අමතර කොටස් පමණි) |

07 - 743

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

### වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2019 ජනවාරි මස 01 වැනි දින සිට 2019 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා රා තැබෑරුම් රේන්ද විකිණීම

2019 ජනවාරි මස 01 වැනි දින සිට 2019 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් බාර ගනු ලැබේ :-

01. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයට සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරය සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ඇමිණිය යුතු ය.

02. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එකී කවරයේ වම් කෙළවරෙහි 'අංක .................. දරන රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය' යනුවෙන් සඳහන් කොට 2018.09.19 වැනි දින පෙ. ව. 10.30ට පෙර වත්තල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

03. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

04. 2018.09.19 වැනි දින පෙරවරු 10.30ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. පූර්වාසන්න දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් රේන්ද නැවත විකිණීම 2018.11.15 වැනි දින පෙරවරු 10.30ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

06. මේ සම්බන්ධ වැඩි විස්තර වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැක.

පී. ඩී. ටී. සී. රාජිකා,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2018 අගෝස්තු මස 16 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| කොට්ඨාසය | ග්‍රාමය | ටෙන්ඩර්පත් බාර ගන්නා අවසාන දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. |
|---|---|---|---|
| වත්තල | අංක 01-තිඹිරිගස්යාය | 20168.09.19 පෙ. ව. 10.30 | 7,260 00 |
| වත්තල | අංක 02-උස්වැටකෙයියාව | එම | 4,840 00 |
| වත්තල | අංක 07-බෝපිටිය | එම | 7,260 00 |
| වත්තල | අංක 08-මහවත්ත | එම | 6,050 00 |

08-1195

## රජයේ නොවන දැන්වීම්

### ඇටර්නි බලය අවලංගු කිරීමයි

මහනුවර තල්වත්ත, හේවාහැට පාරේ, අංක 53/23 දරන ස්ථානයේ පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 725281870 V) හිමි, නිර්මලා අබේධීර වන මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජයරජයටත් පොදු මහජනතාවටත් මෙසේ දන්වා සිටින වග නම්, එකී මා විසින් ශ්‍රී ලංකාවේ මහනුවර තල්වත්ත, හේවාහැට පාරේ, අංක 53/23 හි පදිංචි නිරෝෂ් ලසන්ත අබේධීර වෙත ප්‍රදානය කරන ලද 2015 ජනවාරි මස 01 වැනි දින දාතම හා දින පොත් අංක 4, පත්ඉරු 06, වෙළුම 100 යටතේ මහනුවර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ පවත්වාගෙන යන ලිඛිත බලධාරි පොතේ ලියාපදිංචි කර ඇති සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් විජේසිංහ ආරච්චිගේ සුරංගිකා රණවීර විසින් ලියා සහිතක කර ඇති 2014 දෙසැම්බර් මස 02 වැනි දින හා අංක 800 දරන ඇටර්නි බල පත්‍රය මෙයින් අහෝසි කොට අවලංගුකොට ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබූ බවත් ඔහුගේ ක්‍රියාවන් හා ක්‍රියාකාරකම් සම්බන්ධව මා වගකීමට මෙතැන් සිට බැඳී නොමැති බවත් ය.

නිර්මලා අබේධීර.

08-701

### දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගම් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : බෙන්හම් ෆුඩ්ස් (පීවීටී) එලටීඩී.
2. සංස්ථාගත කළ දිනය : 2018.07.26
3. සමාගමේ අංකය : පීවී. 00202462
4. ලියාපදිංචි ලිපිනය : අංක 65, 2/1ඒ, ගාලු පාර, දෙහිවල උතුර.

එකවුන්ටිං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්.

අංක 67 ඒ ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

08-702

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය අනුව පහත සඳහන් සමාගම ස්ථාපිත කළ බව අපි මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : වෙස්ට් ඒෂියා ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 00201873
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස,
කොළඹ 07.
ස්ථාපිත කළ දිනය : 2018.07.11

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්,
(ප්‍රයිවට්) ලිමිටඩ්.
සමාගම් ලේකම්වරු,

08-704

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය අනුව පහත සඳහන් සමාගම ස්ථාපිත කරන බව අපි මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : සවුත් කෝස්ට් ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 00201992
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07.
ස්ථාපිත කළ දිනය : 2018.07.14

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්,
(ප්‍රයිවට්) ලිමිටඩ්.
සමාගම් ලේකම්වරු,

08-705

### නිවැරදි කිරීමයි

2018.04.20 වැනි දින පළකරන ලද අංක 2068 දරන ගැසට් පත්‍රයේ නිවේදන අංක 04-725 පහත සඳහන් පරිදි නිවැරදි විය යුතු යි.

ඇටෝර්නි බලපත්‍රයේ දිනය : 2017.08.02
ඇටෝර්නි අධිපතිනිගේ නම : කුඩලුගොඩ ආරච්චිලාගේ රෝහිණි කුසුම්ලතා, 424/A/2, ඉහලකන්ද, පහලගම, එල්ලාවල.
ජාතික හැඳුනුම්පත් අංකය : 736821370 V

08-706

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි.

සමාගමේ නාමය : ෆින්රේ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 00202280
ලියාපදිංචි ලිපිනය : අංක 7ඩී/143, ජයවඩනගම, බත්තරමුල්ල.

සඳුන් ගමගේ,
සමාගම් ලේකම්.

08-724

### දැන්වීමයි

2017 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව, පහත නම සඳහන් සමාගම නිසි පරිදි සංස්ථාපනය කල බවට දන්වා කරන දැනුම් දීමයි.

සමාගමේ නම : සෙහංසා මයික්‍රෝ ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලියාපදිංචි අංකය : PV 00201513
ලියාපදිංචි කාර්යාලය : 135/ඒ, කටුවැල්ලේගම, මීගමුව.
සංස්ථාගත කිරීමේ දිනය : 2018 ජූලි මස 03 වැනි දින

සමාගම් ලේකම්.

08-725

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම දැන්වීමයි

මොරටුව, රාවතාවත්ත, චාර්ලිස් පෙදෙස, අංක 11/1හි පදිංචි අඟුරු කන්කානම්ගේ කුමාර චන්ද්‍ර ඒකනායක සහ ස්ටෙෆ්නි සමරකෝන් වන අපගේ අත්සනින් යුතුව අංක 565 හා 2018.11.05 වැනි දිනැති රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවෙහි ලිඛිත බලධාරිකම් හා ඇටර්නි බලපත්‍ර ලේඛනයේ 23 කාණ්ඩයේ 40 පත්ඉරුවේ 8176 දින පොතේ අංකය යටතේ සටහන් වී ඇති ඇටෝර්නි බලපත්‍රය මගින් පානදුර, හිරණ, කලායතන පාර, 1 වන පටුමග, අංක 87 හි පදිංචි අජිත් සමරකෝන් යන අයට දෙන ලද අපගේ ඇටෝර්නි බලය අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමු. ඉහත සඳහන් අජිත් සමරකෝන් යන අය විසින් මින් ඉදිරියට එකී ඇටෝර්නි බලය මගින් කරනු ලබන කිසිදු ගනුදෙනුවකට හෝ ක්‍රියාවකට අප වග නොකියන බව ඉහත සඳහන් සියලු දෙනා වෙත වැඩි දුරටත් දන්වා සිටිමු. වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 06 වැනි දින දී ය.

අඟුරු කන්කානම්ගේ කුමාර චන්ද්‍ර ඒකනායක සහ ස්ටෙෆ්නි සමරකෝන්.

08-726

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි

සමාගම් නාමය : කැෂ්රේ ටෙක්නොලොජීස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 00202473
ලියාපදිංචි ලිපිනය : අංක 7ඩී/143, ජයවඩනගම, බත්තරමුල්ල.

සඳුන් ගමගේ,
සමාගම් ලේකම්.

08-727

### යුටෙක් ටෙක්නොලජිස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම්දීමයි

2018 ජූලි මස 04 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පීවී. 00201573 යටතේ යුටෙක් ටෙක්නොලජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය කොළඹ 00300, ඩීල් පෙදෙස, අංක 02, එම් ඇන්ඩ් එන් බිල්ඩින් ලෙවල් 05 හි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

ප්‍රනවන් නීලකන්ඩන්,
අධ්‍යක්ෂක,
එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු),

එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 00300.

08-732

**ග්‍රීන් හිල්ස් ෆාම් (ප්‍රයිවට්) ලිමිටඩ්**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම්දීමයි

2018 ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින ප.ව. 01.30ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම.-
කොළඹ නගරයට අසන්න නව කැලණි පාළමේ සිට කොළඹ මීගමුව පාරේ, කිලෝමීටර් 2.5 ඉදිරියට එන විට පාරේ වම් අතට ඇති හේකිත්ත පාරට හැරී කිලෝමීටර් 1ක් හේකිත්ත මංසන්ධියෙන් පාරේ වම් අතට ඇති කැනල් පාරට හැරී මීටර් 300 ඉදිරියට ගමන් කරන විට සාගරිකා ක්‍රීඩාංගණය ආසන්නයේ දකුණු පැත්තට ඇති "Crocktain" නැමැති පාරේ මීටර් කිහිපයක් ඉදිරියට යන විට දකුණු පැත්තට "1st lane" පාරට හැරී මීටර් කිහිපයක් ගමන් කරන විට අදළ දේපළ වම් පසින් පිහිටා ඇත.

ගෙවීම් කළ යුතු ආකාරය .- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
2. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30 ක් ඇතුළත නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
5. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%
6. ලිපිකරුගේ හා සෝෂකගේ වේතන රු. 1,000.00
7. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,500.00

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සදහන් නිළධාරීන්ගෙන් විමසන්න : කළමණාකරු මධ්‍යගත (අයකිරීම් අංශය), නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී, අංක 40, නවම් මාවත, කොළඹ 02.
දුරකතන අංක 011-2448448.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙනදේසිකරුවෝ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා
අධිකරණ බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු.,

අංක 200, හල්ස්ඩ්‍රෝෆ් වීදිය,
කොළඹ 12.
දුරකතන අංක : 0773242954, 0112 445393, 0773181891.

08-840

---

### යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ බැන්ක් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, රජගම ප්‍රාදේශීය සභා සීමාවේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 44E, දොලිකන්ද ග්‍රාම නිළධාරි වසමේ, බුස්සේ පිහිටි,"මහගෙදරවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එම් බුද්ධදාස මැන සාදන ලද අංක 63 සහ 2004.05.10 වැනි දින දරන මානක පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 02 දරන බිම් කොටස.

ප්‍රමාණය (අක්කර 0, රූඩ් 2, පර්චස් 22.70)

රූඩ් දෙකයි පර්චස් විසිදෙකයි දශම හතයි බිංදුවයි පහක් විශාල බිම් කොටස, ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග මෙම දේපළ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 30/139 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මාරවිල, ඉහළ හත්තිනිය, පදිංචි ගල්ගමගේ චමින්ද කුමාරසිරි සිල්වා යන අය විසින් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්ලිව්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 30381 සහ 2016.01.04 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරයන් ලියා අත්සන් කොට තබා, එකී මූල්‍ය පහුසකම් මත යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී. එල්. සී. (ලියාපදිංචි අංක PB 676 PQ) වෙත අයවිය යුතු වාර ණය පහසුකම සහ පොළිය ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි ඉහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ සහ පරිශ්‍රය ඇපයක් වශයෙන් උකස් කොට තබා ඇති මාරවිල, ඉහළ හත්තිනිය පදිංචි ගල්ගමගේ චමින්ද කුමාරසිරි යන අය බන්ධනදායි/උකස්කරු වශයෙන් කොළඹ 03, ගාලු පාරේ, අංක 64 හි යූනියන් බැන්ක් ඔෆ් කළම්බු පී. එල්. සී. නමට උකස් කොට ඇපයක් තබා ඇති උකස් බැඳුම්කරය.

යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී. එල්. සී. විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, ඉහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ.

2018 ක් වූ සැප්තැම්බර් මස 13 වැනි දින පෙ.ව. 10.30 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම.- ගාල්ල බස් නැවතුම්පලේ සිට කොළඹ දෙසට සැතපුම් 4 ගමන් කර බුස්ස පන්සල හංදිය පසුකර යාර කිහිපයක් ඉදිරියට ගමන් කරන විට එම මාර්ගයේ දකුණු අත පැත්තේ අදාළ දේපළ පිහිටා ඇති. මෝටර් රථ ගමන් කළ හැකි මාර්ගයකි.

ගෙවීම් කළ යුතු ආකාරය .- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
2. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30 ක් ඇතුළත යූනියන් බැන්ක් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයෙ' තැන්පත් කළ යුතු ය,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2..5%),
4. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
5. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
6. ලිපිකරුගේ හා සෝෂකගේ වේතනය රු. 1,000.00,
7. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,500.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සදහන් නිළධාරීන්ගෙන් විමසන්න - නීති දෙපාර්තමේන්තුව, යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී.එල්.සී., අංක 64, ගාලු පාර, කොළඹ 03.

දුරකතන අංක : 011-2347100.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු -
කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා
අධිකරණය බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු.,

අංක 200, හල්ස්ඩ්‍රෝෆ් වීදිය,
කොළඹ 12.
දුරකතන අංක : 0773242954, 0112 445393, 077-3181891.

08-841

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කිලිනොච්චි ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, කිලිනොච්චි නගර සීමාවේ කරේච්චි ප්‍රාදේශීය සභා සීමාවන් හි (ණහ/23) කිලිනොච්චි ග්‍රාම නිළධාරි වසම තුළ පිහිටි "කිලිනොච්චි කාඩු" නැමති ඉඩමට බලයලත් මානක ඒ. කන්දසාමි විසින් 2016.05.12 වැනි දින සාදන ලද අංක 2016/04/109 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 01 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි දෙමහල් ව්‍යාපාරික ගොඩනැගිල්ල ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 3.66.

මෙම දේපළ නවරතිනම් රවිකුමාර් ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුට සුරක්ෂිත කර ඇත.

දේපළට පිවිසීම.- කිලිනොච්චි හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ශාඛා පරිශ්‍රයේ සිට මහනුවර මාර්ගයේ දකුණු දිසාවට කිමී. 0.60 ක් පමණ උතුරු කන්දසාමි කෝවිල දක්වා ගමන් ගෙන එම කෝවිල පසු කර මීටර් 100ක් පමණ ගිය විට අදාළ දේපළ මහනුවර පාරට මායිම්ව පිහිටා තිබේ.

2018 ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින පෙ.ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.07.06 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2018.07.16 වැනි දින ලක්බිම, ඩේලිමිරර් හා තිනකුරල් පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා විමසන්න .- ජ්‍යෙෂ්ඨ කළමණාකාරු, (වාණිජ අයකිරීම්, අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 011-2661835, 011-2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය.
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු,

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර,
මාවිල්මඩ,
මහනුවර.
දුරකතන අංක : 081-2210595/ 071-8446374/ 071-4962449.

08-852

HNB 271 - 18

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - අනුරාධපුර ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පනත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. ඒ. දිසානායක විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දා වූ ද 2017 ක් වූ ඔක්තෝබර් මස 15 වැනි දින සහතික කළ අංක 5105, 2009 අප්‍රේල් මස 22 වැනි දින සහතික කළ අංක 5709, 2013 අගෝස්තු මස 05 වැනි දින සහතික කළ අංක 7581, 2014 මාර්තු මස 31 වැනි දින සහතික කළ අංක 7925 සහ 2014 ක් වූ අගෝස්තු මස 15 වැනි දින සහතික කළ අංක 8113 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නාත්තණ්ඩිගේ ඇන්ඩෲ නෙවිල් ශාන්ත ප්‍රනාන්දු සහ නාත්තණ්ඩිගේ දිල්මි අර්ජුන ප්‍රනාන්දු ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් හා සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අය කර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2018 ක් වූ සැප්තැම්බර් මස 18 වැනි දින පෙ.ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ - උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නුවර ගම් කෝරළේ, අංක 264 ග්‍රාම නිළධාරි වසමේ දිවුල්වැව හි පිහිටි දිවුල්වැව ඉඩම නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. බී. රත්නසිරි විසින් 2003 ක් වූ මැයි මස 26 වැනි දින මැන සහතික කරන ලද අංක 1311 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 01 වශයෙන් දක්වෙන ඉඩම් කොටස අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් තිස්හතක (අ.1, රූ.1, පර්.37) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2018.03.09 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2018.03.20 දින ලක්බිම, ඩේලිමිරර් හා තිනක්කුරල් පුවත්පත් බලන්න.

ඉඩමට පිවිසීම.- අනුරාධපුර නගරයේ සිට කුරුණෑගල පාරේ, රත්මලේ හන්දිය දක්වා ගමන් කරන්න. එතැනින් නාච්චියාදුව පාරේ නෙලුබෑව හරහා දිවුල්වැව හන්දිය දක්වා කි. මී. 6 ක් පමණ ගමන් කරන්න. එතැනින් දිවුල්වැව හරහා මී. 100ක් පමණ ගියවිට අදාළ විෂය වස්තුව එම පාරේ දකුණ අත පැත්තේ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් (සියයට දහයක්) (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000.00) ක් ද,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තු රුපියල් පන්සීය (රු. 500.00) ක් ද,
6. සියළුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු : ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන : 2661866, 2661828 ගෙන් ලබාගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 56, මඩිහේ නාහිමි මාවත,
මහරගම.
දුරකතන අංක : 0777-378441/ 0714-424478
ෆැක්ස් : 0112-509442.

08-893

---

**හබිබ් බැන්ක් ලිමිටඩ්**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ වූ විකිණීම

හබිබ් බැන්ක් ලිමිටඩ් බැංකුව විසින් මා වෙත ප්‍රදනය කර ඇති බලය යටතේ පහත දක්වෙන දේපළ, එම දේපළ පිහිටි ස්ථානයේ දී 2018 සැප්තැම්බර් මස 14 වන දින පෙරවරු 11.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එච්. කේ. එච්. තිලකරත්න විසින් සහතික කරන ලද 2014.07.30 දින අංක 220 දරන උකස් බැඳුම්කරය සහ හබිබ් බැන්ක් ලිමිටඩ් බැංකුවේ වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එච්. කේ. එච්. තිලකරත්න විසින් සහතික කරන ලද උකස් පනතේ 47A වගන්තිය යටතේ අංක 221 දරන ප්‍රකාශය මත අයවීමට ඇති මුදල් ගෙවීම උකස්කරු වශයෙන් මහනුවර, කොළඹ පාරේ, අංක 233 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි, ලියාපදිංචි අංක PV3219 යටතේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් වූ ඩබ්. ඩී. ආර්. සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් පැහැර හැර ඇති හෙයින්,

යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම සඳහා.-කරුණාකර 2018 පෙබරවාරි මස 02 වන දින දරන රජයේ ගැසට් පත්‍රය සහ 2018 ජනවාරි මස 22 දින දරන ''ද ඩේලි නිව්ස්'' ''දිනමිණ'' සහ ''තිනකරන්'' පුවත්පත් බලන්න.

**දේපළ පිළිබඳ විස්තරය**

01. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර උඩගම්පහ කෝරලේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෙන්ගල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කේන්ගල්ල ග්‍රාමයේ පිහිටි මහනුවර - කෙන්ගල්ල, දිගන පාරේ වරිපනම් අංක 700 දරන කොලොන්ගහවත්ත නම් වූ ඉඩමේ කොටසකට බලයලත් මිණුම්දෝරු බර්නාඩ් පී. රූපසිංහ විසින් සාදන ලද අංක 21/2007 දරන පිඹුරේ ලොට් අංක 01 වශයෙන් නිරූපිත බෙදා වෙන් කල ඉඩමට මායිම් උතුරට :- මහනුවර මහියංගන පාර සහ බලයලත් මිණුම්දෝරු යූ. ආර්. රත්නායක විසින් එම ඉඩමට සාදන ලද අංක 1126 දරන පිඹුරේ ලොට් අංක 1A වශයෙන් ලකුණු කළ කොටස, නැගෙනහිරට : බලයලත් මිනුම්දෝරු යූ. ආර්. රත්නායක විසින් සාදන ලද අංක 1127 දරන පිඹුරේ එම ඉඩමේ ලොට් 1A දරන කොටස සහ බලයලත් මිණුම්දෝරු යූ. ආර්. රත්නායක විසින් 1984 ජුනි මස 10 වන දින සාදන ලද අංක 1127 දරන පිඹුරේ ලොට් 1B දරන කොටස, දකුණට : ඇල සහ බස්නාහිරට : බලයලත් මිණුම්දෝරු යූ. ආර්. රත්නායක විසින් සාදන ලද අංක 1127 දරන පිඹුරේ එම ඉඩමේ ලොට් 1A වශයෙන් ලකුණු කළ කොටස යන මායිම් තුළ පිහිටියාවූද, ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් හයයි දශම අටක් (අක් 01, රූඩ් 02, පර්. 6.8) විශාල වූ බෙදා වෙන්කළ ඉඩම සහ ඒ මත පිහිටි සියළු දේත් ය. එකී ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D52/52 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

02. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර උඩගම්පහ කෝරලේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අස්වලපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කෙන්ගල්ල ග්‍රාමයේ පිහිටි මහනුවර කෙන්ගල්ල අස්වලපිටිය වරිපනම් අංක 702 දරන කොලොන්ගහවත්ත නම් වූ ඉඩමට (බලයලත් මිණුම්දෝරු ඩබ්ලිව්. කේ. එම්. එම්. වැලිවිට විසින් සාදන ලද 1979 මාර්තු මස 10 දින අංක 1052 දරන පිඹුරේ ලොට් අංක 1 දරන කොටසේ උපබෙදුමක් වන) බලයලත් මිණුම්දෝරු යූ. ආර්. රත්නායක විසින් සාදන ලද 1984 ජුනි මස 10 දින අංක 1127 දරන පිඹුරේ ලොට් 1B වශයෙන් නිරූපිත බෙදා වෙන්කළ ඉඩමට මායිම් : ඊසාන දෙසට : අංක 1126 දරන පිඹුරේ කොලොන්ගහවත්ත ඉඩමේ ලොට් 1A දරන කොටස, දකුණට : කුඹුර, බස්නාහිරට : අංක 1127 දරන පිඹුරේ ලොට් 1B දරන කොටසේ ඉතිරි කොටස, උතුරට : අංක 1127 දරන පිඹුරේ ලොට් 1A දරන ඉඩමේ කොටසේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටියාවූද ප්‍රමාණයෙන් පර්චස් විසි අටයි දශම පහක් (අක්. 0, රූ. 0, පර්. 28.5) විශාල ඉඩම සහ ඒ මත පිහිටි සියළු දේත් ය. ඉහතකී ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D31/75 දරන වෙළුමේ/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී උකස් දේපළට අමතරව ඩබ්. ඩී. ආර්. සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන සමාගමට අයත් වෙනත් යම් දේපළ.

2018 සැප්තැම්බර් මස 14 වැනි දින පෙ.ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසිය.

දේපළට ප්‍රවේශවීම.- මහනුවර නගරයේ සිට හේවාහැට A26 මහා මාර්ගයේ (දිගන පාරේ) කිලෝ මීටර් 12 පමණ ගමන් කරන විට කෙන්ගල්ල ග්‍රාමය හමුවේ. තවත් ඉදිරියට ගමන් කරන විට කෙන්ගල්ල රජයේ මහා විද්‍යාලය අසල අංක 13/6 දරන බෝක්කුව හමුවේ. එම ස්ථානයෙන් දකුණු පස මහාමාර්ගයට යාබඳව දේපළ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- පහත දක්වෙන මුදල් ප්‍රමාණයන් වෙන්දේසිකරුට මුදලින් ගෙවිය යුතුය-

1. මිලදී ගැනීමේ මුදලින් 10% ක්,
2. පළාත් පාලන ආයතනයේ ගාස්තු වශයෙන් 1% ක් සහ එකී මුදල මත වැට් බදු,
3. මිලදී ගැනීමේ මිලෙන් 2.5% ක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන්,
4. විකිණීම සඳහා වැය වූ වෙනත් ගාස්තු,
5. වෙළඳ ප්‍රචාරක ගාස්තු,
6. ලිපිකරුගේ සහ සෝෂක ගාස්තු වශයෙන් රුපියල් 2,500 ක්,
7. විකිණීමේ කොන්දේසි සඳහා නොතාරිස්වරයාගේ සහතික කිරීමේ ගාස්තු.

විකිණීමේ කොන්දේසි :- මිලදී ගැනීමේ මිලෙන් 90% ක් වූ ඉතිරි මුදල වෙන්දේසියේ දින සිට දින 30 ක් ඇතුළත බැංකුවට ගෙවනු ලැබිය යුතු ය. දින 30 ක් ඇතුළත එකී ඉතිරි මුදල ගෙවනු නොලැබුවහොත් මිලදී ගැනීමේ මිලෙන් 10% ක් වූ දැනටමත් ගෙවා ඇති මුදල බැංකුව සතුකරගෙන දේපල නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුව පවතී.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ ලේඛණ පරීක්ෂා කිරීම සහ ඒවායේ පිටපත් ලබා ගැනීම :- කොළඹ 03, ධර්මපාල මාවතේ, අංක 70 දරන ස්ථානයේ පිහිටි හබිබ් බැන්ක් ලිමිටඩ් බැංකුවේ අයකර ගැනීමේ කළමනාකරු වෙතින් ලබාගත හැකිය. දුරකථන අංක 011-2370391, සහ ෆැක්ස් : 011-2370393

පියරත්න මුතුකුමාරණ,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 56, මඩිහේ නාහිමි මාවත, (කටුවාවල පාර),
මහරගම.
දුරකථන අංකය : 0777378441, 0714-424478.

08-885

---

**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව**

2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 40 වන සංශෝධනය මගින් සහ 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදනය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුවේ, ගන්තිහේ කෝරළේ, මහව ප්‍රාදේශීය සභා බලසීමාව තුළ පිහිටි අඹන්පොල ප්‍රාදේශීයේ ලේකම් කොට්ඨාසයේ අංක 191 උඩංගාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කිවුලේගම නැමති ග්‍රාමයේ පිහිටි අ. ග. පි. 3178 හි කැබලි අංක 02 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම දෙකයි බිංදුවයි බිංදුවයි බිංදුවයි (හෙක්ටයාර 0.2000) රජයේ ඉඩමෙන් මැන වෙන්කර ඇති 2016 අප්‍රේල් මස 28 වන දිනැති කුරුණෑගල මිනින්දෝරු අධිකාරිවරයා විසින් නිකුත් කර ඇති අ. ග. පි. 3178 හි අතිරේක අංක 06 පත්‍ර අංක 06 හි කැබලි අංක 105 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම එකයි බිංදුවයි බිංදුවයි බිංදුවයි (හෙක්ටයාර 0.1000) විශාල බිම් කොටස.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2018 සැප්තැම්බර් මස 13 වැනි බ්‍රහස්පතින්දා දින පෙ. ව. 11.00ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තීරණය පිළිබඳ දැන්වීම .- කරුණාකර 2018 පෙබරවාරි මස 09 වන දින රජයේ ගැසට් පත්‍රයද 2018 අප්‍රේල් මස 12 වන දිනැති දිනමිණ, ඩේලි, නිවුස් සහ තිනකරන් පුවත්පත්ද බලන්න.

දේපල වෙත පිවිසීම.- අඹන්පොළ බස් නැවතුමේ සිට කුරුණෑගල පාරේ මීටර් 500ක් පමණ ගිය විට අදළ දේපළ පාරේ දකුණු පසින් අඹන්පොළ මධ්‍ය මහා විද්‍යාලයට එදිරිව පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 25% ක් (සියයට විසිපහක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර) සහ එම කොමිස් මුදලට අදළ සියළුම බදු,
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැනුම් මිලෙන් 75% (සියයට හැත්තෑ පහ) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත කළමණාකරු, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, අඹන්පොළ ශාඛාව, අනුරාධපුර පාර අඹන්පොළ වෙත ගෙවිය යුතුවේ. දුරකථන 037 2253535.

ඉහත සඳහන් කල පරිදි දින 30ක් ඇතුලත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 25% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

ඔප්පු සහ අනෙකුත් ලියකියවිලිවල පිටපත් ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 126 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

ප්‍රධාන කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

නගර කාර්යාලය :
6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

08-710

---

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2018 අංක 744

MOD/DEF/02/01/ARF/RET/1733.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2018 අගෝස්තු මස 02 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කර්නල් (උපකරණ පාලක) ජයසිංහ මුදියන්සේලාගේ අනිල් ධර්මප්‍රිය ජයසිංහ බණ්ඩාර, යූඑස්පී ශ්‍රීලයුවෛබ (නි/63126)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2018 අගෝස්තු මස 02 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කර්නල් (උපකරණ පාලක) ජයසිංහ මුදියන්සේලාගේ අනිල් ධර්මප්‍රිය ජයසිංහ බණ්ඩාර, යූඑස්පී ශ්‍රීලයුවෛබ (නි/63126)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජුනි මස 25 වැනි දින,
කොළඹ දී ය.

08 - 765

2018 අංක 745

MOD/DEF/02/01/ARF/RET/1732.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2018 සැප්තැම්බර් මස 11 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් (උපකරණ පාලක) මල්ලියා වඩුගේ ප්‍රේමලාල් කුසුමතුංග, ශ්‍රීලකාහ (නි/65895)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2018 සැප්තැම්බර් මස 11 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් (උපකරණ පාලක) මල්ලියා වඩුගේ ප්‍රේමලාල් කුසුමතුංග, ශ්‍රීලකාහ (නි/65895)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජූනි මස 29 වැනි දින,
කොළඹ දී ය.

08 - 764

---

2018 අංක 746

MOD/DEF/02/01/ARF/RET/1707.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2018 අගෝස්තු මස 29 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් පොන්රසගේ ශාන්ත කුමාර ජයවර්ධන, ගැහේබ (නි/64726)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2018 අගෝස්තු මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් පොන්රසගේ ශාන්ත කුමාර ජයවර්ධන, ගැහේබ (නි/64726)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජූනි මස 29 වැනි දින,
කොළඹ දී ය.

08 - 763

---

2018 අංක 747

MOD/DEF/02/01/ARF/RET/1731.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2018 සැප්තැම්බර් මස 05 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් මහ උඩුවගේ චන්ද්‍රසිරි පෙරේරා, ආර්එස්පී යූඑස්පී ගැහේබ (නි/63685)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජූනි මස 29 වැනි දින,
කොළඹ දී ය.

08 - 767

---

2018 අංක 748

MOD/DEF/02/01/ARF/RET/1752.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2018 සැප්තැම්බර් මස 17 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් මොහරාජගේ රාජරත්න පියරත්න, ශ්‍රීලසසබ (නි/64169)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 අගෝස්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

08 - 762

---

2018 අංක 749

MOD/DEF/02/01/ARF/RET/1706.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2018 අගෝස්තු මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතාන් කුලප්පුවා වඩු රොෂාන්, යූඑස්පී ශ්‍රීලකාහ (නි/66446)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජූනි මස 29 වැනි දින,
කොළඹ දී ය.

08 - 766

---

2018 අංක 750

MOD/DEF/02/01/ARF/RET/1728.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2018 සැප්තැම්බර් මස 04 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් (උපකරණ පාලක) දසනායක මුදියන්සේලැ නැකත් රාලලැ ගෙදර ලලිත් ප්‍රියන්ත දසනායක, ආර්ඩබ්පී ගරෙ (නි/69417)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජූනි මස 29 වැනි දින,
කොළඹ දී ය.

08 - 768

---

2018 අංක 751

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
උසස් කිරීම

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර ගෲප් කැප්ටන් නිලයට උසස් කෙරේ.

තාවකාලික ගෲප් කැප්ටන් දොන් රජින්ද් විජේසිංහ ජයවර්ධන (01874) පරිපාලන 2018.12.31

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජූලි මස 25 වැනි දින,
කොළඹ දී ය.

08 - 878/3

---

2018 අංක 752

MOD/DEF/10/03/RET/201.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

2018 ජූලි මස 01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

විංග් කමාන්ඩර් දෙවුන්දර කංකානම්ගේ මංජුල ක්‍රිශාන්ත (02037) - නියමු පොදු රාජකාරි

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජූලි මස 06 වැනි දින,
කොළඹ දී ය.

08 - 758

---

2018 අංක 753

MOD/DEF/10/03/RET/205.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

2018 සැප්තැම්බර් මස 22 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

විංග් කමාන්ඩර් රනමුක කංකානමලාගේ ප්‍රියන්ත උදය කුමාර (02162) - නියමු පොදු රාජකාරි

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 අගෝස්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

08 - 769

---

2018 අංක 754

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
උසස් කිරීම

පහත නම සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර විංග් කමාන්ඩර් නිලයට උසස් කෙරේ.

තාවකාලික විංග් කමාන්ඩර් රංග ශමේන්ද්‍ර තිරානගම (02013) නි.පො.රා. 2015.07.15

තාවකාලික විංග් කමාන්ඩර් ලියනගේ ජනක විජේන්ද්‍ර පෙරේරා (02004) ගු.තො.නි. 2015.12.31

තාවකාලික විංග් කමාන්ඩර් පැල්පොලගේ දොන් සමීර සුචරිත ගුණවර්ධන (02121) නි.පො.රා. 2016.03.05

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජූලි මස 25 වැනි දින,
කොළඹ දී ය.

08 - 878/2

---

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
උසස් කිරීම් අවලංගු කිරීම

පහත නම සඳහන් නිලධාරීන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට බලපැවැත්වෙන ස්ථිර විංග් කමාන්ඩර් නිලයට උසස් කිරීම අවලංගු කරන ලදී.

තාවකාලික විංග් කමාන්ඩර් රංග ශමේන්ද්‍ර තිරානගම (02013) නි.පො.රා. 2015.07.20

තාවකාලික විංග් කමාන්ඩර් ලියනගේ ජනක විජේන්ද්‍ර පෙරේරා (02004) ගු.තො.නි. 2016.03.15

තාවකාලික විංග් කමාන්ඩර් පැල්පොලගේ දොන් සමීර සුචරිත ගුණවර්ධන (02121) නි.පො.රා. 2016.06.05

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජූලි මස 25 වැනි දින,
කොළඹ දී ය.

08 - 878/1

---

2018 අංක 755

MOD/DEF/10/03/EOS/05/2018.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
සේවා කාලය දීර්ඝ කිරීමක්

පහත නම සඳහන් නිලධාරියාගේ ස්ථිර විංග් කමාන්ඩර් නිලයේ සේවා කාලය 2018 ජූනි මස 02 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මාස 06 දීර්ඝ කෙරේ.

තාවකාලික ගෲප් කැප්ටන් කැලිස්ටස් රෝහිත ඩයස් ගුණවර්ධන (02792) - පරිපාලන රෙජිමේන්තු-

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජූලි මස 18 වැනි දින,
කොළඹ දී ය.

08 - 877

---

2018 අංක 756

MOD/DEF/10/03/RET/202.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

2018 අගෝස්තු මස 28 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ස්කොඩ්රන් ලීඩර් කෝට්ටයලාගේ රෝහිත ලක්ෂමන් (02772) - පරිපාලන රෙජිමේන්තු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජූනි මස 29 වැනි දින,
කොළඹ දී ය.

08 - 759

2018 අංක 757

MOD/DEF/10/03/RES/110.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2018 මැයි මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ෆ්ලයිං ඔෆිසර් බනගේ වත්ත ගෙදර මාධව ලක්මාල් බණ්ඩාර (03694) - දන්ත වෛද්‍ය

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජූනි මස 29 වැනි දින,
කොළඹ දී ය.

08 - 760

2018 අංක 758

MOD/DEF/10/03/COM/RAF.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
අධිකාරියට පත් කිරීම්

පහත නම් සඳහන් නැඩෙට් නිලධාරින් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර් නිලයේ අධිකාරියට පත් කිරීමටත් එදිනම සිට ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති ශාඛාවන්ට ඇතුළත් කිරීමටත් අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළකොට ඇත.

11905 කැඩෙට් නිලධාරි ක්‍රාවේගේ යදීශ අනුරන්ග රත්නසිරි වෛද්‍ය - 2014.08.02

12006 කැඩෙට් නිලධාරි වැඩිප්පුලි ආරච්චිගේ ට්‍රෙවීන් හේම්ෂ් ආනන්ද වෛද්‍ය - 2014.08.02

12007 කැඩෙට් නිලධාරි හිරාන් ලක්දිමුතු කංකානම් පතිරණ වෛද්‍ය - 2014.08.02

12008 කැඩෙට් නිලධාරි සඳරු සරංජය ගයාන්ප්‍රිය උෟරල ලියනගේ වෛද්‍ය - 2014.08.02

LOC/ 0641කැඩෙට් නිලධාරිනී ගලිම්බුරේ ගමරාලලාගේ ශාලිනී නදීජා වෛද්‍ය - 2014.08.02

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජූලි මස 06 වැනි දින,
කොළඹ දී ය.

08 - 761

# රජයේ නිවේදන

**අංක H/24 321889 දරන පොදු 172 කුවිතාන්සිය අස්ථානගත වීම**

ගාල්ල දිසා අධිකරණය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලද පොදු 172 කුවිතාන්සි පත්‍රයන්හි අතුළත්ව තිබූ H/24 321889 දරන කුවිතාන්සියෙහි මුල් පිටපත 2018.07.18 වැනි දින අස්ථානගත වී ඇති බැවින් එම කුවිතාන්සිය භාවිතා කර කරනු ලබන කිසිදු ක්‍රියාවක් වලංගු නොවන බව නිවේදනය කරමි.

ලක්මල් වික්‍රමසූරිය,
දිසා විනිසුරු,
ගාල්ල.

2018.අගෝස්තු මස 09 වැනි දින,
ගාල්ල දිසා අධිකරණයේ දී ය.

08 - 960

---

මගේ යොමු අංක : ඊඩී/1/8/2/2/මො/26

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26, 27 සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 03 (06) (අ), (ඇ), (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

මොණරාගල දිස්ත්‍රික්කයේ කතරගම, රජමාවත, කඳසුරිඳුගම, ශ්‍රී බෝධිරාජ විහාරයේ පිහිටි මො/ශ්‍රී බෝධිලංකාර මූලික පිරිවෙන 2015.01.05 වැනි දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරි ස්වාමීන් වහන්සේ වන පූජ්‍ය කිරින්දේ රතනාලංකාර ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 03 (06) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත් මෙම දැන්වීම පළ වී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුනිල් හෙට්ටිආරච්චි,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2018 අගෝස්තු මස 06 වැනි දින,
බත්තරමුල්ල,
ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

08 - 737

---

මගේ යොමු අංක : ඊඩී/1/8/2/2/හම්/35

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26, 27 සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 03 (06) (අ), (ඇ), (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව, කරඬුලෙන ආරණ්‍ය සේනාසනයේ පිහිටි හම්/ශ්‍රී ධම්මාවාස ද්විභාෂා මූලික පිරිවෙන 2015.05.15 වැනි දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරී ස්වාමීන් වහන්සේ වන පූජ්‍ය මිද්දෙණියේ නාගිත ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 03 (06) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත් මෙම දැන්වීම පළ වී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුනිල් හෙට්ටිආරච්චි,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2018 අගෝස්තු මස 06 වැනි දින,
බත්තරමුල්ල,
ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

08 - 738

---

මගේ යොමු අංක : ඊඩී/1/8/2/2/හම්/36

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26, 27 සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 03 (06) (අ), (ඇ), (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හකුරුවෙල, උඩයාල, කසාගල රජමහා විහාරයේ පිහිටි හම්/ ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මූලික පිරිවෙන 2016.09.08 වැනි දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරී ස්වාමීන් වහන්සේ වන පූජ්‍ය මුරුංගස්යායේ හේමසිරි ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 03 (06) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත් මෙම දැන්වීම පළ වී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුනිල් හෙට්ටිආරච්චි,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2018 අගෝස්තු මස 06 වැනි දින,
බත්තරමුල්ල,
ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

08 - 739

---

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කොටපොල**

වන්දනා ගමන් ආඥා පනත (175) වැනි අධිකාරිය-ගැටබරු රජමහා විහාරස්ථානයේ වාර්ෂික ඇසළ උත්සවය - 2018

මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඓතිහාසික ගැටබරුව රජමහා විහාරස්ථානයේ ඇසල උත්සවය 2018 සැප්තැම්බර් 20 සිට 26 දක්වා පවත්වනු ලබන බව (175 අධිකාරිය වූ) වන්දනා ගමන් ආඥාපනත යටතේ 1988 මාර්තු මස 31 වැනි දින නිකුත් කරන ලද අංක 500 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 1 වැනි කොටස 1 ඡේදයේ (සාමාන්‍ය) ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසි යටතේ මෙයින් දන්වමි.

ගනේෂ් අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2018 ජූලි මස 3 වැනි දින කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 741

---

**ආයිතියමලේ සදා සරණ මැණියෝ දෙවස්ථානය**
**වාර්ෂික උත්සවය - 2018**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1991 නොවැම්බර් 01 වැනි දිනැති 687 අංක දරන ගැසට් පත්‍රයේ පළ කර තිබූ නිවේදනය අනුව යාත්‍රා ආඥාපනතේ 2 වන වගන්තිය (175 වන අධිකාරය වූ) යටතේ ආයිතියමලේ සදා සරණ මැණියෝ දෙවස්ථානයේ වාර්ෂික උත්සවය මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනේ බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2018.08.24 වැනිදා කොඩි එසවීමෙන් ආරම්භ වී 2018.09.02 වැනිදා තෙක් පැවැත්වේ යැයි මෙයින් ප්‍රකාශ කරමි.

එස්. සුතාකර්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මන්මුනේ බටහිර,
වව්නතිව්.

08-770

---

**ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය - ගලේවල**
**වන්දනා ගමන් ආඥාපනත**

ගලේවල ඓතිහාසික බම්බාව රජමහා විහාරස්ථානයේ වාර්ෂික ඇසළ මහා පෙරහැර

මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඓතිහාසික බම්බාව රජමහා විහාරස්ථානයේ, වාර්ෂික ඇසළ මහා පෙරහැර 2018 සැප්තැම්බර් මස 07. 08 දිනවල පැවැත්වෙන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පල කර රෙගුලාසිවල දෙවැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එම්. යූ. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
ගලේවල.

08-772

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ක් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.07.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සිටි පැෂන් ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එන්. දිලිරුක්ෂි විසින් සහතික කරන ලද අංක 163 සහ 2018 ජනවාරි මස 02 වැනි දින දරන උකස් බැඳුම්කරය මඟින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය. ඉහත කී සිටි පැෂන් ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් බන්ධනදායි සහ උකස්කරු ලෙස ක්‍රියාකරමින් ඉහත කී සිටි පැෂන් ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට, ඇපයට තබා ඇති බැවින් ද,

එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී පහුසකම් මත ආපසු ගෙවීම ඉහත කී සිටි පැෂන් ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

ඒ අනුව වාර ණය පහසුකම් නිසා 2018.06.12 වැනි දිනට රුපියල් විසිඅට මිලියන තුන්සිය හැටඑක්දහස් අටසිය හැටඑකකුත් ශත විසිඑකක (රු. 28,361,861.21) මුදල සහ 2018.06.12 වැනි දිනට හිඟ මුල් මුදල වන රුපියල් විසිහත් මිලියන හයසිය තිස්හයදහස් දෙසිය අසූඅටකුත් ශත හතළිස්පහක (රු. 27,636,288.45) මුදල මත එකඟ වූ පරිදි, 2018.06.13 වැනි දින සිට තවදුරටත් පොළිය ද, තව ද, සම්බන්ධිත ගාස්තු, ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩු කොට, අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා සහ/හෝ එල්. බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයෙ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 208 දරන නැගෙනහිර පහල, බියන්විල ග්‍රාමනිලධාරි වසමේ, පහල බියන්විල පිහිටි දෙල්ගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එස්. ජයලත් විසින් මැන සාදන ලද අංක 2015/1356 සහ 2015.06.04 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කැබලි අක්ෂර X දරන බිම් කොටසට මායිම්, උතුරට : නුවර පාර ද, නැගෙනහිරට : එම ඉඩමේම දැනට පී. වී. මැගිනෝනා යන අයගේ ඉඩම් කොටස ද, දකුණට : සයිමන්හාමි යන අයගේ ඉඩම ද, බස්නාහිරට : නුවර පාරේ වරිපනම් අංක 338/2 දරන පරිශ්‍රය ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2015/1356 දරන පිඹුර අනුව පර්චස් දොළහකුත් දශම අටයි පහක් (අ. 0, රූ. 0, පර්. 12.85) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිල්ල, ඇතුළු සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 400/12 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා.
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

08 - 773

**සෙලාන් බැංකුව පීඑල්සී - ගාල්ල ශාඛාව**
**(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත)**

1990 අංක 4 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ
(විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනාව

ගිණුම් අංකය : 0160 - 00009038-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.07.25 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. දසිතා ප්‍රියන්ති මිය විසින් දෙකම සහතික කරන ලද 2014.12.29 දිනැති අංක 490 සහ 2016.04.29 දිනැති අංක 987 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, අහංගම පදිංචි ගාරදියේ පුංචිහේවගේ ප්‍රියන්ත ද සිල්වා යන අය බන්ධනදායී වශයෙන් රුපියල් පනස් හතර ලක්ෂ අසූතුන් දහස් තුන්සිය තිස් තුනයි ශත විසිනවයක (රු. 5,483,333.29) මුදලක් මත, එකී බැඳුම්කර මත වාර ණය 1 පහසුකම සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් මස 06 වැනි දින සිට වසරකට සියයට දහ අට (18%) බැගින් පොළිය සමග රුපියල් පනස්අට ලක්ෂ දහ දහස් පන්සිය අසූපහයි ශත තිස්පහක (5,810,585.35) මුදලක් 2017 දෙසැම්බර් මස 05 වැනි දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුදල වන රුපියල් පනස්අට ලක්ෂ දහ දහස් පන්සිය අසූපහයි ශත තිස්පහක (5,810,585.35) මුදල 2017 දෙසැම්බර් මස 06 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට පෙරකී පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 490 සහ 987 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර චන්දිමා ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, හබරාදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ අහංගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අහංගම පිහිටි බලයලත් මිනිදෝරු රෝහණ උයන්ගොඩ විසින් සාදන ලද 2014.10.09 දිනැති අංක 2164 දරන සැලැස්මේ නිරූපණය වන පහලසූරියගහවත්ත නැගෙනහිර කොටස නමැති ඉඩමේ ලොට් ඒ ලකුණු කර බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : රෝහණ මහා විද්‍යාල පරිශ්‍රය සහ බෝධිය බදුගේ ජයතුහාමි හෙවත් ජේම්ස් සිල්වාට හිමි ඉඩම ද, නැගෙනහිරට : නිවෙස්වලට යන පාර ද, දකුණට : ගාල්ල සිට මාතරට යන පාර සහ බස්නාහිරට : රෝහණ මහා විද්‍යාල පරිශ්‍රය ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් දහ හතරයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 14.50) නොහොත් හෙක්ටයාර 0.13785ක් විශාල, බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

එකී ලොට් ඒ ලකුණු කළ ඉඩම පහත සඳහන් ඉඩමේ නැවත මැනීමක් වේ.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, හබරාදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංහගම මධ්‍යම ග්‍රාම නිලධාරි තුළ කොට්ඨාසය අංහගම පිහිටි සූරියගහවත්ත නැගෙනහිර කොටස නමැති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : බී. බී. ජයතුහාමි හෙවත් ජේම්ස් සිල්වා විසින් හිමිකම් කියනු ලබන කොටසේ ගල්වැට ද, නැගෙනහිරට : අන්දිරිස් සිල්වා විසින් හිමිකම් කියනු ලබන මඩිල්ලගහවත්ත ද, දකුණට : මහා මාර්ගය සහ බස්නාහිරට : ඩී. එල්. ද එස්. මනුකුලසූරිය විසින් හිමිකම් කියනු ලබන කොටසේ ගල්වැට හෙවත් බිත්තිය ද යන මායිම් තුළ අක්කර එකක් (අ. 1, රූ. 0, පර්. 0) විශාල බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඩී 782/65හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය,
නීති ප්‍රධානී.

08 - 869

**සෙලාන් බැංකුව පීඑල්සී - ගාල්ල ශාඛාව**
**2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමු පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත**

1990 අංක 4 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ
(විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනාව

ගිණුම් අංකය : 0160 - 33365706-101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.07.25 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. දසිතා ප්‍රියන්ති මෙය විසින් සහතික කරන ලද 2014.12.03 දිනැති බැඳුම්කර අංක 466 මත අයවිය යුතු මුදල් ගෙවීම, ගාල්ල පදිංචි දෙනගමගේ මංජුල කපිල කුමාර සහ සමර හේවා රංගා දර්ශනී යන අය බන්ධදායීන් වශයෙන් රුපියල් හැත්තෑ හතර ලක්ෂ දාහතර දහස් හාරසිහ දොළහයි ශත දට අටක (රු. 7,414,412.18) මුදලක් මත, එකී බැඳුම්කර මත සමාන වාරික ණය පහසුකම සම්බන්ධයෙන් 2018 මාර්තු මස 06 වැනි දින සිට වසරකට සියයට දහ නවය (19%) බැගින් පොළිය සමග රුපියල් හැත්තෑපන් ලක්ෂ අසූ දහස් එකසිය හැත්තෑහතයි ශත අනූ හතක (රු. 7,580,177.97) මුදලක් 2018 මාර්තු මස 05 වැනි දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුදල වන රුපියල් හැත්තෑ පන් ලක්ෂ අසූ දහස් එකසිය හැත්තෑහතයි ශත අනූහතක (රු. 7,580,177.97) මුදල 2018 මාර්තු 06 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට පෙරකී පොළීය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 466 දරන උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්තක කරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, පෝද්දල බෝපේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ 124සී-කහදූවවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කිතුලම්පිටිය පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එන්. ඩබ්ලිව්. ලියනගේ විසින් සාදන ලද 2004.03.23 දිනැති අංක 3439 දරන සැලැස්මේ නිරූපනය වන බඹරන්දේගොඩවත්තේ ලොට් 03න් ලොට් 4න් ලොට් 4බී ලකුණු කර බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ධම්මානන්ද මාවත ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 5 ද, දකුණට : මෙම ඉඩමේ ලොට් 2 සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 1 ද යන මායිම් තුළ පර්චස් විසිතුනක් (අ. 0, රූ. 0, පර්. 23) විශාල බිම, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර් 47/59හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය,
නීති ප්‍රධානී.

08 - 870

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කොළඹ කොටුව ශාඛාව**
**2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමු පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත**

සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනාව

ගිණුම් අංකය : 0300 - 32347860 - 101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.07.25 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) සංශෝධිත පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. ආර්. පුෂ්පා කුමාරි මිය විසින් සහතික කරන ලද 2010.11.03 දිනැති අංක 1117 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ගොඩිග මුව පදිංචි හේරත් මුදියන්සේලාගේ චමිලා දිල්රුක්ෂි යන අය බන්ධදායීන් වශයෙන් රුපියල් අසු ලක්ෂ හැත්තෑ අට දහස් අටසිය පනස් අටයි ශත හයක (රු. 8,078,858.06) මුදලක් 2018 අප්‍රේල් මස 25 වැනි දින සිට වසරකට සියයට දහ නවය (19%) බැගින් පොළිය සමග එකී බැඳුම්කරය මත පියස සිරි නිවාස, නිවාස ණය පහසුකම් සම්බන්ධයෙන් 2018 අප්‍රේල් මස 24 වැනි දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් අසූ හතර ලක්ෂ අනූ හතර දහස් හයසිය තිස්හතරයි ශත හැට පහක (රු. 8,494,634.65) මුදලක් සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුදල වන රුපියල් අසූ හතර ලක්ෂ අනූ හතර දහස් හයසිය තිස්හතරයි ශත හැට පහක (රු. 8,494,634.65) 2018 අප්‍රේල් මස 25 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා පෙරකී පොළීය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී උකස් බැඳුම්කර අංක 1117 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ ගොඩිගමුව පිහිටි බලයලත් මිනින්දෝරු නලීන් හේරත් විසින් සාදන ලද 2004 අප්‍රේල් මස 28 දිනැති අංක 2004/130 සැලැස්මේ නිරූපනය වන නීලම්මහර පාර වරිපනම් අංක 128/10 දරන කෝන්ගහවත්ත සහ මීගහවත්ත නමැති ඉඩමේ ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු නලීන් හේරත් විසින් සාදන ලද 2004 මාර්තු 03 දිනැති අංක 2004/70 සැලැස්මේ නිරූපනය වන ලොට් 2ඒහි නැවත මැනීමක් වන අතුරු බෙදීමක් වන) බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් ආර් 4 (පාර සඳහා වෙන්කිරීම) සහ ලොට් ආර් 1 (අඩි 20 පළල පාර) ද, නැගෙනහිරට : ලොට් ආර් 2 (අඩි 20ක් පළල පාර) ද, දකුණට : ලොට් 2 ද සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එච්. ඕ. ශාර්ගයිනෙවේල් විසින් සාදන ලද සැලැස්මේ සඳහන් ලොට් 1 ද යන මායිම් තුළ එකී අංක 2004/130 දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 9.50) විශාල ඉඩම, මෙය දෙල්කඳ - නුගේගොඩ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම 2750/218 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය සහ නගර සභා සීමාව තුළ ගොඩිගමුව පිහිටි බලයලත් මිනින්දෝරු නලීන් හේරත් විසින් සාදන ලද 2004 මාර්තු මස 03 දිනැති අංක 2004/70 සැලැස්මේ නිරූපනය වන කෝන්ගහවත්ත සහ මීගහවත්ත නමැති ඉඩමේ ලොට් 2 බී (පාර සඳහා වෙනකිරීම) ලකුණු කළ (බලයලත් මිනින්දෝරු එච්. ඕ. ශාර්ගයිනෙවේල් විසින් සාදන ලද 1948 මාර්තු මස 12 දිනැති සැලැස්මේ නිරූපනය වන ලොට් 2හි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 2ඒ ද, නැගෙනහිරට : පාර ද, දකුණට : මීගහවත්ත සහ ලොට් 2ඒ සහ බස්නාහිරට : ලොට් 2ඒ ද යන මායිම් තුළ එකී අංක 2004/70 දරන සැලැස්ම අනුව පර්චස් හතයි දශම හතරයි අටක් (අ. 0, රූ. 0, පර්. 07.48) නොහොත් හෙක්ටයාර් 0.0189ක් විශාල, ඉඩම මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2750/27 යටතේ ලියාපදිංචි කර ඇත.

(2) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය නගර සභා සීමාව තුළ ගොඩිගමුව පිහිටි බලයලත් මිනින්දෝරු නලීන් හේරත් විසින් සාදන ලද 2004 අප්‍රේල් මස 28 දිනැති අංක 2004/130 සැලැස්මේ නිරූපනය වන කෝන්ගහවත්ත සහ මීගහවත්ත නමැති ඉඩමේ ලොට් ආර් 2 (අඩි 20ක් පළල පාර සඳහා වෙන්කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් ආර් 1 ද, නැගෙනහිරට : ලොට්ස් 20, 12, ආර් 3, 11, 10, 9 සහ 8 ද, දකුණට : ලොට්ස් 8 සහ 7 සහ බස්නාහිරට : ලොට්ස් 7, 6, 5, 4, 3, 2 සහ 1 ද යන මායිම් තුළ එකී අංක 2004/130 දරන සැලැස්ම අනුව පර්චස් දහසයයි දශම නවයයි එකක් (අ. 0, රූ. 0, පර්. 16.91) නොහොත් හෙක්ටයාර 0.0428ක් විශාල ඉඩම, මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2750/240 යටතේ ලියාපදංචි කර ඇත.

(3) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ ගොඩිගමුව පිහිටි බලයලත් මිනින්දෝරු නලීන් හේරත් විසින් සාදන ලද 2004 අප්‍රේල් මස 28 දිනැති අංක 2004/130 සැලැස්මේ නිරූපනය වන කෝන්ගහවත්ත සහ මීගහවත්ත නමැති ඉඩමේ ලොට් ආර් 3 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන්කරන ලද ඉඩමේ කොටසට මායිම්, උතුරට : ලොට්ස් 12, 14, 15 සහ 16 ද, නැගෙනහිරට : මීගහවත්ත සහ අංක 2004/70 සැලැස්මේ සඳහන් ලොට් 2බී ද, දකුණට : අංක 2004/70 සැලැස්මේ සඳහල් ලොට් 2බී සහ ලොට් 11 සහ බස්නාහිරට : ලොට් ආර් 2 ද යන මායිම් තුළ එකී අංක 2004/130 දරන සැලැස්ම අනුව පර්චස් පහයි දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 05.70) නොහොත් හෙක්ටයාර 0.0144ක් විශාල ඉඩම. මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2750/216 යටතේ ලියාපදංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය,
නීති ප්‍රධානී.

08 - 871

---

**I කොටස : I ඡේදය යටතේ පළවන ඉතිරි දැන්වීම් 2018.08.24 දින ගැසට් පත්‍රයේ පළවේ.**

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk